### සභාපති මාඕ සේතුං

# ''චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් කැඳවනලද විශාල කළ ක්‍රියාකාරක සම්මන්ත්‍රණයේදී කළ කථාව''

ජූනි 30, පීකිං (ශින්හ්වා) - චීන කොමියුනිස්ට් පක්ෂය ආරම්භ කිරීමේ 57 වැනි සංවත්සරය සිහිකිරීම පිණිස, පක්ෂ මධ්‍යම කාරකසභාවේ න්‍යායික සඟරාව වන **''රතු කොඩිය''** එහි හත්වැනි කලාපයෙහි 1962, ජනවාරි 30 වැනි දින සභාපති මාඕ විසින් **''චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් කැඳවන ලද ක්‍රියාකාරක සම්මන්ත්‍රණයේදී කළ කථාව''** පළ කරයි. ඒ කථාවේ සම්පූර්ණ පෙළ පහත දැක්වේ:

සහෝදරවරුනි! මම දැන් අදහස් කීපයක් ඉදිරිපත් කිරීමට යමි. (උණුසුම් අත්පොළසන්) මම, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පිළිබඳ ප්‍රශ්නය කේන්ද්‍රය කර ගන්නා අතර වෙනත් ප්‍රශ්නවලට ද අත තබමින්, එකතුව ගත් කල කරුණු හයක් ගැන කතා කරමි.

**පළමුවැනි කරුණ: වර්තමාන සම්මන්ත්‍රණය පවත්වනු ලබන ආකාරය.**

මිනිස්සු 7000 කට වැඩි ගණනක් මේ විශාල කළ මධ්‍යම ක්‍රියාකාරක සම්මන්ත්‍රණයට පැමිණ සිටිති. ආරම්භයේදී, සහෝදරවරු කීප දෙනෙක් කෙටුම්පත් වාර්තාවක් පිළියෙල කළහ. කෙටුම්පත මධ්‍යම කාරකසභාවේ දේශපාලන මණ්ඩලය විසින් සාකච්ඡා කළ හැකි වීමට පෙර, එය සාකච්ඡා කිරීම පිණිස පළමුකොට දේශපාලන මණ්ඩලයේ රැස්වීමක් පවත්වනවාට වඩා, සම්මන්ත්‍රණයට පැමිණෙන සහෝදරවරුන්ගේ විවේචන සහ අදහස් දැනගැනීම සඳහා අප විසින් එය වහා ම ඒ සහෝදරවරුන් වෙත නිකුත් කළ යුතු ය' යි මම ඔවුන්ට යෝජනා කළෙමි. සහෝදරවරුනි, විවිධ ක්ෂේත්‍රවලින් සහ ප්‍රදේශවලින් - පළාත්බද, ප්‍රිපෙක්චර සහ කෝරළ කොමිටිවලින්, විවිධ ව්‍යවසායවල පක්ෂ කොමිටිවලින් සහ මධ්‍යම කාර්යාංශවලින් පැමිණි අය ඔබ අතර සිටිති. ඔබ අතුරෙන් බොහෝ දෙනා ස්ථාවර කොමිටියේ, දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරකසභාවේ ලේකම්මණ්ඩලයේ සිටින සහෝදරවරුන් වන අපට වඩා පහළ මට්ටම්වලට කිට්ටු ය, තත්ත්වය සහ ප්‍රශ්න අපට වඩා හොඳින් දැන සිටිය යුතු ය. ඇරත්, ඔබ නොයෙක් පදවිවල සිටින නිසා, නොයෙක් කෝණවලින් ප්‍රශ්න නඟන්නට ඔබට හැකි ය. අන්න ඒ නිසා ය අප ඔබගේ අදහස් ඉල්ලා සිටිය යුත්තේ. බලාපොරොත්තු වූ පරිදි, කෙටුම්පත් වාර්තාව ඔබ වෙත නිකුත් කළ පසු, එය ප්‍රාණවත් සාකච්ඡා ඇති කළේය. මධ්‍යම කාරකසභාවේ පදනම් ප්‍රතිපත්තිය සමග එකඟ වන අතර, ඔබ බොහෝ අදහස් ද ඉදිරිපත් කළහ. පසු ව, විසි එක් දෙනෙකුන්ගෙන් යුත් කෙටුම්පත් කොමිටියක් පත් කරනු ලැබී ය, මධ්‍යම කාරකසභාවේ ප්‍රාන්තීය මණ්ඩලවලින් වග කිව යුතු සාමාජිකයෝ ද ඊට ඇතුළත් වූහ. දින අටක් සාකච්ඡා කිරීමෙන් පසු එය වාර්තාවේ දෙවැනි කෙටුම්පත මිනිසුන් 7000 කට වැඩි ගණනක් විසින් කළ සාකච්ඡාවක් මධ්‍යම කාරකසභාව විසින් සාරමය කිරීම වේ ය' යි කිව යුතු ය. ඔබගේ අදහස් කොමැතිව එය ලියන්නට පුළුවන්කමක් නො තිබුණේ ය. පළමුවැනි කොටස සහ දෙවැනි කොටස යන දෙක ම දෙවැනි කෙටුම්පතේදී ඉතා සැලකිය යුතු සංශෝධනයකට භාජනය වී ඇත. මේ ගැන ගෞරවය දිය යුත්තේ ඔබට ය. ඔබ සියලු දෙනා ම දෙවැනි කෙටුම්පත ගැන උදක් හිතකර ලෙස අදහස් දක්වා ඇති බවත්, එය තරමක් හොඳ ය' යි කල්පනා කරන බවත් මට අසන්නට ලැබී ඇත. අප මේ ක්‍රමය නො යෙදුවා නම්, සාමාන්‍ය පිළිවෙලට සම්මන්ත්‍රණය පවත්වාගෙන ගියා නම් - ඒ කියන්නේ, පළමුව වාර්තාවට කන්දීම, ඉක්බිති එය සාකච්ඡා කොට, අත් එසවීමකින් එය අනුමත කිරීම කළා නම් - අපෙන් මේ වැඩය මේ තරම් හොඳින් නොකෙරෙන්නට ඉඩ තිබුණේ ය.

මෙය රැස්වීම පවත්වන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රශ්නයකි. කෙටුම්පත බෙදහරින්න, පැමිණ සිටින අයගෙන් විවේචන ඉල්ලා සිටින්න, වාර්තාවක් දීමට පෙර ඒ අනුව සංශෝධනයන් කරන්න. වාර්තාවක් කරන කල, අයෙක් එය නිකම්ම කියවාගෙන යා යුතු නො වේ, පරිපූරක අදහස් සහ පැහැදිලි කිරීම් කිසිවක් ද ඉදිරිපත් කළ යුතු ය. මේ ක්‍රමය අනුගමනය කිරීමෙන් වඩාත් සම්පූර්ණ ලෙස ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීමට, හැම දිසාවෙන් ම ප්‍රඥාව එක් තැන් කිරීමට සහ, විවිධ මත සංසන්දනය කිරීමට අපට හැකි වේ; අපේ රැස්වීම් වඩාත් ප්‍රබෝධමත් වෙනවා ඇත. දෙළොස් වසරක, වෙසෙසින් පසුගිය සිව් වසරේ අත්දැකීම් සම්පිණ්ඩනය කිරීමට පවත්වනු ලබන වර්තමාන සම්මන්ත්‍රණය සඳහා, බොහෝ ප්‍රශ්න ද, ඒ හේතුවෙන් බොහෝ මත ද තිබෙන නිසා, මේ ක්‍රමය යෙදීම ප්‍රඥාගෝචර වී ඇත. එහෙත් මේ ක්‍රමය යෙදීමට සියලු ම සම්මන්ත්‍රණවලට හැකි ද? නැත, සියල්ලට ම නොවේ. මේ ක්‍රමය යෙදීමට අපට හුඟක් කාලය තිබිය යුතු ය. එය ඇතැම් විට අපේ මහජන නියෝජිත සම්මේලනවල සැසිවලදී යොදන්නට ඉඩ තිබේ. පළාත්බද, ප්‍රිපෙක්චර සහ කෝරළ පක්ෂ කොමිටිවලින් පැමිණ සිටින සහෝදරවරුනි, ඔබ මින් මතු රැස්වීම් කැඳවන විට, තත්ත්වයන්ගෙන් අවසර ලැබෙනවා නම් මේ ක්‍රමය යෙදීමට ඔබටත් හැකි ය. සත්තකින් ම, ඔබට වැඩ බහුල ය. සාමාන්‍යයෙන් සම්මන්ත්‍රණ ගැන හුඟක් කාලය වැය කරන්නට ඔබට බැරි ය. එහෙත් තත්ත්වයන් හරි බව ඔබට පෙනී යනවා නම් උත්සාහයක් කර බැලීමේ වරදක් නැත.

NMSG Library

මෙය මොන විධියේ ක්‍රමයක් ද? එය ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයේ ක්‍රමය යි, බහුජන ක්‍රියාමාර්ගයේ ක්‍රමය යිඃ පළමුව ප්‍රජාතන්ත්‍රවාදය, ඉක්බිති මධ්‍යගතවාදය; බහුජනයා වෙතින්, බහුජනයා වෙත; නායකත්වය බහුජනයා සමග ඒකීභූත කිරීම, මෙය මට සාකච්ඡා කිරීමට උවමනා කළ පළමුවැනි කරුණ යි.

**දෙවැනි කරුණඃ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පිළිබඳ ප්‍රශ්නය.**

අපේ සහෝදරවරුන් අතුරෙන් සමහරුන්ට මාක්ස් සහ ලෙනින් විසින් විස්තර කරනලද පරිද්දෙන් ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය තව ම වැටහෙන්නේ නැතුවා මෙන් පෙනෙයි. මේ සහෝදරවරුන් අතුරෙන් සමහරු දැනටමත් ප්‍රවීණ විප්ලවවාදියෝ ය, 1938 අච්චුවේ හෝ වෙන අච්චුවක අය ය - කොයි හැටි වුවත්, ඔවුහු දශක කීපයක් තිස්සේ කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් වී සිට ඇත, මේ ප්‍රශ්නය තව ම ඔවුන්ට වැටහෙන්නේ නැත. ඔවුහු බහුජනයාට බිය වෙති, බහුජනයා කට ඇර කතා කරනවාට බය වෙති, බහුජන විවේචනයට බිය වෙති. බහුජනයාට බිය වීමට මාක්ස් - ලෙනින්වාදීන්හට තිබිය හැක්කේ කවර හේතුවක් ද? මේ සහෝදරවරු, ඔවුන්ගේ ම වැරදි ඔවුන් විසින් ම සඳහන් කිරීමෙන් මග අරින අතර, ඔවුන්ගේ වැරදි බහුජනයා විසින් සඳහන් කරනු ලබනවාටත් ඒ වාගේ ම බිය වෙති. ඔවුන් වැඩි වැඩියෙන් බිය වන විට, අවතාර වැඩි වැඩියෙන් ඔවුන්ට හොල්මන් කරනවා ඇත. මගේ අදහස අනුව, අයෙක් බිය විය යුතු නැත. බිය වීමට තිබෙන්නේ කුමක් ද? අපේ ආකල්පය, සත්‍යය නඟා තබන්න, මහත් කැමැත්තෙන් වැරදි නිවැරදි කරන්න යනු යි. අපේ වැඩවල හරි කුමක් ද, හරි නැත්තේ කුමක් ද, නිවැරදි කුමක් ද, වැරදි කුමක් ද යන ප්‍රශ්නය ජනතාව අතර ප්‍රතිවිරෝධයන් යටතට වැටේ. ජනතාව අතර ප්‍රතිවිරෝධ රොස් පරොස් බස්වලින් වත් මිට මෙළ වූ අත්වලින් වත් විසඳන්නට බැරි ය. පිහිවලින් හෝ තුවක්කුවලින් නම් ඒ තරම් වත් බැරි ය. ඒවා විසඳිය හැක්කේ සාකච්ඡා කිරීමෙන් සහ තර්ක කිරීමෙන්, විවේචනයෙන් සහ ස්වයං විවේචනයෙන් පමණකි. කොටින් ම, ඒවා විසඳිය හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය මගින්, බහුජනයාට කට ඇර කතා කරන්නට ඉඩ දීම මගින් පමණකි.

පක්ෂය ඇතුළතත් ඉන් පිටතත් පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය තිබිය යුතු ය, ඒ කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පරිමණ්ඩල දෙක ම තුළ ඉතා ඕනෑකමින් භාවිතාවේ යෙදිය යුතු බව ය. ප්‍රශ්න අකුටිල ලෙස ම එළියට ගෙන ආ යුතු ය, නො වළහා කතා කරන්නට, අප පරිභවයට භාජන කිරීමට යතත් නො වළහා කතා කරන්නට, බහුජනයාට ඉඩ දිය යුතු ය. මේ පරිභවයෙන් සිදු විය හැකි නරක ම දෙය අප විසිවී ඇදවැටීම යි, එසේ අප දැනට සිටින වැඩවල දිගට ම සිටීමට බැරි වීම යි - තත්ත්වයෙන් පහත දමා පහළ ආයතනවලට යැවීම හෝ වෙන ප්‍රදේශවලට මාරු කිරීම යි. එය ඒ තරම් විඳින්නට බැරි දෙයක් ද? යම්කිසි තැනැත්තෙක් ඉහළ ම පමණක් යා යුත්තේ, පහළ නො යා යුත්තේ මන්ද? අයෙක් එක් තැනක පමණක් වැඩ කළ යුත්තේ, තව තැනකට මාරු නො කළ යුත්තේ මන්ද? යුක්ති සහගත වුවත් නුවූවත්, තත්ත්වයෙන් පහත දැමීම සහ මාරු කිරීම යන දෙකේ ම වාසි තිබේ ය' යි මම සිතමි. ඒවා මිනිසුන්ගේ විප්ලවවාදී සිත පණ පොවන්නට ආධාර කරයි, බොහෝ අළුත් තත්ත්වයන් පරීක්ෂා කිරීමට හා අධ්‍යයනය කිරීමටත්, වඩාත් ප්‍රයෝජනවත් දැනුම අත් කර ගැනීමටත් ඔවුන්ට හැකි කරයි. මමත් මේ අතින් අත්දැකීම් ලබා ඇත්තෙමි, එයින් මට විශාල යහපතක් සිදු විය. ඔබ මා කියන කරුණ විශ්වාස කරන්නේ නැත්නම්, එය අත්හදා බලන්නට ඔබට පුළුවනි. ස්සුමා චියන් මෙසේ කීවේ ය; ''වෙන් රජු හිරඅඩස්සි කරනු ලැබූ විට, ඔහු 'වෙනස්වීම පිළිබඳ පොත' සම්පාදන ය කළේ ය; කොන්ෆියුසියස් ව්‍යසනයට පත් වී සිටියදී, ඔහු 'වසන්ත සහ සරත් වෘත්තාන්ත' සංග්‍රහ කළේය. චූ යුවාන් පිටුවහල් කරනු ලැබී ය, එහෙයින් 'ලි සාඕ' රචනා කළේ ය. ත්සෝච්යු මිංගේ ඇස් පෙනීම නැති විය, ඊට පසු 'කුවෝ යූ' ආවේ ය. සුන් ත්සු, ඔහු යුද්ධ විද්‍යාව ගැන ඔහුගේ පොත ලිවීමට පෙර කපනු කොටනු ලැබී ය. එහෙයින් ලෝකයට ඔහුගේ 'ලූ ලාන්' උරුම විය. හාන් පෙයි, චින් රාජ්‍යයේදී දඟගෙයි දමනු ලැබී ය, ඔහු ඔහුගේ ශ්‍රේෂ්ඨ කෘතියේ පරිච්ඡේද දෙකක් වන, 'ශුයි නාන්' සහ 'කු පෙන්' ලීවේ ය. 'ස්තෝත්‍ර කාව්‍ය පොතේ' කවි තුන්සියය අතුරෙන් වැඩි ගණනක් මුනිවරයන් විසින් ලියනලද්දේ ඔවුන්ගේ හිර කරනු ලැබ තිබුණු උදහස පිට කිරීමට ය.''

නූතන කාලයන්හි, මිනිසුන් ඇත්ත වශයෙන් ම වෙන් රජ 'වෙනස්වීම් පිළිබඳ පොත' සම්පාදනය කළේ ද, නැතහොත් කොන්ෆියුසියස් 'වසන්ත සහ සරත් වෘත්තාන්තය' සංග්‍රහ කළේ ද යන්න ගැන සැක පහළ කර ඇත; මේ උදාහරණ පැත්තකට කර තබන්නටත්, මේ ප්‍රශ්න විසඳීමට විශේෂඥයන්ට ඉඩ දෙන්නටත් අපට පුළුවනි. එහෙත් මේ දේ සැබෑ ය, යි ස්සුමා චියන් විශ්වාස කළේ ය. වෙන් රජු හිරඅඩස්සි කරනු ලැබූ බවත්, කොන්ෆියුසියස් ව්‍යසනයට පත් වී සිටි බවත් සත්‍ය කරුණකි. ත්සෝච්යු මිංගේ ඇස් අන්ධ වීම පිළිබඳ සිද්ධිය හැරුණු කල, ස්සුමා චියන් කියන සිද්ධි සියල්ල සඳහන් කරන්නේ පුරාණ කාලයන්හි මිනිසුන්ගේ ලොක්කන් ඔවුන් ගැන වැරදි ලෙස ක්‍රියා කිරීම ගැන ය. අපත් සමහර කාඩර්වරුන් ගැන වැරදි ලෙස ක්‍රියා කළ අවස්ථා තිබුණේය; ඔවුන් ගැන ක්‍රියා කළ ආකාරය වැරදි වූයේ සම්පූර්ණයෙන් ම වුවත් කොටසකින් පමණක් වුවත් කමක් නැත, නැවත විභාග කර බැලීමෙන් පසු ඔවුහු එක් එක් ප්‍රශ්නයේ සුදුසුකම් අනුව පුනරුත්ථාපනය කළ යුත්තාහ. එහෙත්, සාමාන්‍ය වශයෙන් කියන කළ, එබඳු වැරදි සංග්‍රහය - තත්ත්වයෙන් පහත දැමීම හෝ මාරු කිරීම - ඔවුන්ගේ විප්ලවවාදී සිත පණ පොවයි, බහුජනයාගෙන් හුඟක් අළුත් දැනුම උරා ගැනීමට ඔවුන්ට හැකි කරයි.

මෙහිදී මා, පැරැන්නන් වෙන් රජු හිර අඩස්සි කළාක් මෙන්, කොන්පියුසියස්ට හිරිහැර කළාක් මෙන්, වූ යුවාන් නෙරපුවාක් මෙන්, සුන් ත්සුගේ දණළටුකට්ට ගලවා දැමුවාක් මෙන්, අපේ කාඩර්වරුන්ට, අපේ සහෝදරවරුන්ට හෝ වෙන කාට වත් වග විභාගයක් නැති ව, වැරදි අන්දමට සංග්‍රහ කිරීම අනුමත කරමින් කතා නො කරන බව පැහැදිලි කළ යුතු ය. මේ විධියට වැඩ කිරීම අනුමත කරමින් මා කතා කරන්නේ නැත, මා ඊට විරුද්ධ යි. මා අදහස් කරන්නේ මිනිස් ඉතිහාසයේ හැම අවධියක ම එසේ වැරදි ලෙස ක්‍රියා කළ අවස්ථා හැම විට ම තිබී ඇති බව ය. පංක්ති සමාජයන්හි එබඳු අවස්ථා ගණනින් බොහෝ ය. සමාජවාදී සමාජයකත් එබඳු දේ මුළුමනින් ම වළක්වන්නට නො හැකි ය. නිවැරදි ක්‍රියාමාර්ගයක් සහිත නායකත්වයක් පවතින වකවානුවල වේවා, වැරදි ක්‍රියාමාර්ගයක් සහිත නායකත්වයක් පවතින වකවානුවල වේවා, ඒවා නො වැළැක්විය හැකි ය. කෙසේ වේවා, එක් වෙනසක් ඇත. නිවැරදි ක්‍රියාමාර්ගයක් යටතේ, වැරදි ලෙස ක්‍රියා කර තිබෙන අවස්ථා සොයා ගනු ලැබූ වහා ම, නැවත විභාග කර බැලීමෙන් පසු අදාළ අය, ඔවුන් යළිත් සිතේ සැනසිල්ල ආස්වාදය කරමින්, ඔවුන්ගේ හිස් ඔසවාගෙන සිටින සේ, පුනරුත්ථාපනය කරනු ලබත්, ඔවුන්ගෙන් සමාව ඉල්ලීම කරනු ලැබේ. එහෙත් වැරදි ක්‍රියාමාර්ගයක් යටතේ, මෙය නො කළ හැකි වේ, උචිත අවස්ථාවකදී වැරදි හරිගැස්සිය හැකි වන්නේ නිවැරදි ක්‍රියාමාර්ගය නියෝජනය කරන අය විසින් ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයේ ක්‍රමය තුළින් පමණි. ඇත්ත වශයෙන් ම වැරදි කර ඇත්තාවූ ද, සහෝදරවරුන් විසින් කළ විවේචනයටත්, ඉහළ මට්ටමකදී කළ සමාලෝචනයකටත් පසු, නිවැරදි ලෙස තත්ත්වයෙන් පහත දමා හෝ මාරු කර සිටින්නාවූ අය සම්බන්ධයෙන්, එබඳු තත්ත්වයෙන් පහත දැමීම හෝ මාරු කිරීම ඔවුන්ගේ වැරදි හරිගස්සා ගැනීමටත්, අළුත් දැනුම ලබා ගැනීමටත්, ඔවුන්ට ආධාර කරනවා ඇතැ' යි යනු කිව යුත්තක් නො වේ.

දැනට, බහුජනයා සාකච්ඡාව මුලපුරනවාටත් නායක අවයවවල හෝ නායකයන්ගේ අදහස්වලට වෙනස් අදහස් ඉදිරියට දමනවාටත් බෙහෙවින් බිය වන ඇතැම් සහෝදරවරු සිටිති. ප්‍රශ්නයක් සාකච්ඡා කරන හැම විට ම, ඔවුහු බහුජනයාගේ මුලපිරුම මර්ධනය කරති; ඔවුන්ට කට ඇර කතා කිරීමට ඉඩ නො දෙති. මේ ආකල්පය අතිශයින් ම පිළිකුල් කටයුතු ය. ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය අපේ පක්ෂ ව්‍යවස්ථාවට සහ රාජ්‍ය ව්‍යවස්ථාවට ඇතුළත් කොට ලියා ඇත, නමුත් ඔවුහු එය භාවිතාවේ නො යොදති. සහෝදරවරුනි, අපි විප්ලවවාදියෝ වෙමු. අප ඇත්ත වශයෙන් ම වැරදි කර තිබෙනවා නම්, පක්ෂයේ ව්‍යායාමයට සහ ජනතාවට හානිකර වූ වැරදි කර තිබෙනවා නම්, අපි බහුජනයාගේත් සහෝදරවරුන්ගේත් අදහස් සෙවිය යුත්තෙමු, අප ම විවේචනය කළ යුත්තෙමු. එබඳු ස්වයං විවේචන ඇතැම් විට කීප වරක් නැවත නැවත කළ යුතු ය. එක් වරක් නො සෑහේ නම් ද, මිනිසුන් තෘප්තියට පත් නො වෙත් නම් ද, එය දෙවෙනි වරටත් කළ යුතු ය; ඔවුන් ඒ වන විටත් තෘප්තියට පත් වී නැත් නම්, එවිට එය තුන්වැනි වරටත් කළ යුතු ය; කිසිවකුට තව කිසි ම විවේචනයක් නැති වන තුරු එය එසේ කරගෙන යා යුතු ය. සමහර පළාත්බද පක්ෂ කොමිටි කර තිබෙන්නේ මෙන්න මේ දේ ම යි. පළාත් කීපයක් කිසියම් මුලපිරුමක් පළ කරමින්, මිනිසුන්ට කට ඇර කතා කිරීමට ඉඩ දී ඇත. මුල් ම ඒවා ස්වයං-විවේචනය පටන් ගත්තේ 1959 දී ය, පහු වී පටන් ගත් අය එය ආරම්භ කළේ 1961 දී ය. හෝනාන්, කාන්සු සහ චිංහායි වැනි ඇතැම් පළාත් ස්වයං-විවේචනය කරගෙන යාමට බල කරනු ලැබී ය. දැන් පමණක් ස්වයං-විවේචනය පටන් ගන්නා බව පෙනෙන වෙන පළාත් තිබේ ය' යි සමහර අය කියති. ඒ පළාත් ස්වයං-විවේචනය කරගෙන යන්නේ තම මුලපිරුම පිට වුවත්, නැතහොත් බලකරනු ලැබීම නිසා වුවත් කමක් නැත, ඒවා කලින් ම එසේ කරතත්, නැතහොත් පමා වී කරතත් කමක් නැත, ඒවා තම වැරදි දෙස සෘජුව බලයි නම් සහ ඒ වැරදි පිළිගෙන නිවැරදි කිරීමට කැමති වේ නම් ද, ඒවා විවේචනය කිරීමට බහුජනයාට ඉඩ දෙයි නම් ද - ඒවා මේ ආකල්පය ඇසුරු කරතොත්, අපි සෑම විට ම එය සාදරයෙන් පිළිගත යුත්තෙමු.

විවේචනය සහ ස්වයං-විවේචනය ක්‍රමයකි; එය ජනතාව අතර ප්‍රතිවිරෝධයන් විසඳීමේ ක්‍රමය වේ, ඇත්තෙන් ම එක ම ක්‍රමය වේ. වෙන ක්‍රමයක් නැත. එහෙත් අපට පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය නොමැත්තේ නම්, අප ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය සැබවින් ම භාවිතාවේ නො යොදන්නේ නම්, විවේචනය සහ ස්වයං-විවේචනය පිළිබඳ මේ ක්‍රමය භාවිතාවේ යොදන්නට බැරි ය.

මේ දැනුත් අපට බොහෝ දුෂ්කරතා නොමැත්තේ ද? අප බහුජනයා මත හේත්තු වුව හොත් මිසක්, බහුජනයාගේ සහ කාඩර්වරුන්ගේ උද්‍යෝගය ඇවිස්සුව හොත් මිසක්, මේ දුෂ්කරතා මැඩ පැවැත්වීම නො කළ හැකි ය. එහෙත් ඔබ බහුජනයාට සහ කාඩර්වරුන්ට තත්ත්වය පැහැදිලි නො කරතොත්, ඔවුන්ට ඔබගේ හදවත් විවෘත නො කරතොත් සහ ඔවුන්ගේ අදහස් පැවසීමට ඔවුනට ඉඩ නො දෙතොත්, ඔවුන් එතෙක් ම ඔබට බිය වෙතොත් සහ කතා කරන්නට එඩිතර නො වෙතොත්, ඔවුන්ගේ උද්‍යෝගය අවුස්සන්නට බැරි වෙනවා ඇත. ''මධ්‍යගතවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය යන දෙක ම, විනය සහ නිදහස යන දෙක ම, කැමැත්තේ ඒකත්වය සහ පෞද්ගලික හිතේ සැනසිල්ල හා ප්‍රාණවත්භාවය යන දෙක ම අපට තිබෙන දේශපාලන තත්ත්වයක්'' අප විසින් ඇති කළ යුතු බව මම 1957 දී කීවෙමි. අපි එබඳු දේශපාලන තත්ත්වයක් පක්ෂය ඇතුළතත් ඉන් පිටතත් ඇති කළ යුතුයි. නොඑසේ නම් බහුජනයාගේ උද්‍යෝගය ඇවිස්සිය නො හැකි වෙනවා ඇත. ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව දුෂ්කරතා මැඩ පැවැත්වීමට අපට බැරි ය. සත්තකින් ම, මධ්‍යගතවාදය නොමැතිව එසේ කිරීමට ඊටත් වඩා බැරි ය. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය නොමැත්තේ නම් කිසි ම මධ්‍යගතවාදයක් නො තිබෙනවා ඇත.

NMSG Library

ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව නිවැරදි මධ්‍යගතවාදය තිබෙන්නට නො හැකි ය; මිනිසුන්ට එකිනෙකට වෙනස් මත ඇති කල සහ අවබෝධයේ ඒකත්වය නොමැති කල මධ්‍යගතවාදය ස්ථාපිත නො කළ හැකි නිසා ය. මධ්‍යගතවාදය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? පළමුව, නිවැරදි අදහස් ඒකරාශී වීම තිබිය යුතු ය. අවබෝධයේ, ප්‍රතිපත්තියේ, සැලැස්මේ, විධානයේ සහ ක්‍රියාවේ ඒකත්වය අත් කර ගනු ලබන්නේ නිවැරදි අදහස් ඒකරාශී වීමේ පදනම මත ය. මෙය මධ්‍යගතවාදය තුළින් එක්සත්කම යි, එහෙත් අදාළ සියලු දෙනාට ම ප්‍රශ්න ගැන පැහැදිලි වැටහීමක් තව ම නැත්නම්, ඔවුන්ගේ මත තවම ප්‍රකාශ වී නැත් නම්, හෝ ඔවුන්ගේ කෝපය තව ම පිට වී නැත්නම්, ඔබ මේ මධ්‍යගතවාදය තුළින් එක්සත්කම අත් කර ගන්නේ කෙසේ ද? ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව, නිවැරදි ලෙස අත්දැකීම් සම්පිණ්ඩනය කළ නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව, බහුජනයා වෙතින් අදහස් එන්නේ නැතිව, හොඳ ක්‍රියාමාර්ග, මූලධර්ම, ප්‍රතිපත්ති හෝ ක්‍රම සකස් කළ නො හැකි ය. ක්‍රියාමාර්ග, මූලධර්ම, ප්‍රතිපත්ති සහ ක්‍රම සකස් කිරීම අදාළ ව පවත්නා පමණකින්, අපේ නායක අවයව කරන්නේ හුදෙක් ප්‍රොසෙස් කිරීමේ කම්හලක කොටස රඟපෑම පමණකි. අමු ද්‍රව්‍ය නොමැතිව මොන ම ප්‍රොසෙස් කිරීමක් වත් කිරීමට පැක්ටෙරියකට නො හැකි බව කවුරුත් දනිති. අමු ද්‍රව්‍ය සම්භාරයෙන් ප්‍රමාණවත් සහ තත්ත්වයෙන් යෝග්‍ය වෙතොත් මිසක් හොඳ නිම කළ නිෂ්පාදිතයන් නිපදවීමට ඊට නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය නොමැත්තේ නම්, පහළ සිදුවේගෙන යන දේ ගැන දැනුම සහ ඒ ගැන පැහැදිලි අදහසක් නොමැත්තේ නම්, අදාළ සියලු දෙනාගේ ම මත ප්‍රමාණවත් පරිදි විමසා බැලීමක් සහ ඉහළ සහ පහළ මට්ටම් අතර කතාබස් කර ගැනීමක් නොමැත්තේ නම් ද, ඒ වෙනුවට ඉහළ මට්ටම්වල නායක අවයව විසින් එක පැත්තක් පමණක් සලකන හෝ වැරදි සහිත කරුණුවල ශක්තිය මත ප්‍රශ්න තීරණය කරනු ලැබේ නම් ද, එවිට එබඳු තීරණ මනෝමූලික වීම වැළැක්වීම ඉතා අමාරු වෙනවා ඇත, අවබෝධයෙහි සහ ක්‍රියාවෙහි ඒකත්වය අත් කර ගැනීමට හෝ සැබෑ මධ්‍යගතවාදය අත් කර ගැනීමට හෝ නො හැකි වෙනවා ඇත. අපේ වර්තමාන සම්මන්ත්‍රණයේ ප්‍රධාන මාතෘකාව විමධ්‍යගතවාදයට විරුද්ධ වීම සහ මධ්‍යගතවාදය සහ සමගිය ශක්තිමත් කිරීම නො වේ ද? ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණ ප්‍රමාණයෙන් දියුණු කිරීමට අප අසමත් වෙතොත්, එවිට මේ මධ්‍යගතවාදය, මේ සමගිය අව්‍යාජ වේ ද, නැතහොත් ව්‍යාජ වේ ද? එය සැබෑ වේ ද, නැතහොත් හිස් වේ ද? එය නිවැරදි වේ ද, නැතහොත් වැරදි වේ ද? සත්තකින් ම එය හුදෙක් ව්‍යාජ, හිස් සහ වැරදි වෙනවා ඇත.

අපේ මධ්‍යගතවාදය ප්‍රජාතන්ත්‍රවාදයේ අඩිතාලම මත ගොඩනගනලද මධ්‍යගතවාදය යි. නිර්ධනපංක්ති මධ්‍යගතවාදය පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් සහිත මධ්‍යගතවාදයයි. සියලු මට්ටම්වල පක්ෂ කොමිටි මධ්‍යගත නායකත්වය ක්‍රියාවේ යොදන අවයව වේ. එහෙත් පක්ෂ කොමිටිය මගින් නායකත්වය මගින් යන්නෙන් අදහස් කරන්නේ සාමූහික නායකත්වය යි, පළමුවැනි ලේකම් විසින් පමණක් හිතුවක්කාර තීරණ ගැනීම නො වේ. පක්ෂ කොමිටි ඇතුළත, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය පමණක් භාවිතාවේ යෙදිය යුතු ය. පළමුවැනි ලේකම් සහ සෙසු ලේකම්වරුන් ද කොමිටි සාමාජිකයන් ද අතර සබඳතාව සුළු පිරිස වැඩි පිරිසට අවනත වීම පිළිබඳ එකකි. උදාහරණයක් වශයෙන් මධ්‍යම කාරකසභාවේ ස්ථාවර කොමිටිය හෝ දේශපාලන මණ්ඩලය ගන්න. මා කිසිවක් කියන විට, එය නිවැරදි ද වැරදි ද යන්න ගැන තැකීමක් නැති ව, අනික් අය එකඟ නො වෙත් නම්, ඔවුන් වැඩි පිරිස වන නිසා මා ඔවුන්ගේ මතයට එකඟ විය යුතු වීම බොහෝ විට සිදුවන්නකි. සියලු ම කරුණ පළමුවැනි ලේකම් විසින් පමණක් තීරණය කරනු ලබන පළාත්බද, ප්‍රිපෙක්චර සහ කෝරළ පක්ෂ කොමිටි වගයක් දැන් තිබෙන බව මට කියා ඇත. මෙය සම්පූර්ණයෙන් ම වැරදි ය. එක පුද්ගලයෙකු කියන දේ වලංගු වේ යන අදහස හරි ය'යි ඔප්පු කිරීමට අපට කෙසේ හැකි වේ ද? මා මෙහිදී සඳහන් කරන්නේ වැදගත් කටයුතු ගැන ය, තීරණයන් ගත් පසු එළඹෙන සාමාන්‍ය එදිනෙදා වැඩ ගැන නො වේ. කාරණයක් වැදගත් නම්, එය සාමූහිකව සාකච්ඡා කළ යුතු ය, විවිධ මත සැලකිල්ලට ගත යුතු ය, තත්ත්වයේ සංකීර්ණතාවයන් සහ එකඟ නොවන මත බැරෑරුම් ලෙස විශ්ලේෂණය කළ යුතු ය. විය හැකි විවිධ දේට සිත යොමු කළ යුතු ය, තත්ත්වයක විවිධ පැති ගැන, හොඳ කුමක් ද නරක කුමක් ද, පහසු කුමක් ද අමාරු කුමක් ද, කළ හැකි කුමක් ද නො කළ හැකි කුමක් ද යනාදිය ගැන තක්සේරු කළ යුතු ය. මෙය කළ යුත්තේ හැකි තරම් සැලකිල්ලෙන් සහ අනූන ලෙස ය. වෙන අයුරකින් ක්‍රියා කිරීම එක මිනිහකුගේ දුෂ්ට පාලනයයි. ඒ පළමුවෙනි ලේකම්වරුන්ට කිව යුත්තේ දුෂ්ට පාලකයෝ කියා ය, ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය භාවිතාවේ යොදන ''ස්ක්වොඩ් නායකයෝ'' කියා නො වේ. එකමත් එක කලෙක එක්තරා ශියාං යූ කෙනෙක් සිටියේ ය, ඔහුට කියන ලද්දේ බටහිර චූ රාජ්‍යයේ දුෂ්ට පාලකයා කියා ය. ඔහු තමාගේ මතයට වෙනස් මතවලට කන් දීම බෙහෙවින් ම පිළිකුල් කළේ ය. එක් පාන් ත්සෙං කෙනෙක් ඔහුට අවවාද දීමට ඉදිරිපත් විය, එහෙත් ශියාං යූ ඔහුට කියන්නට තිබුණු දේට කන් දුන්නේ නැත. ලියු පාං නමින් තවත් මිනිසෙක්, එනම්, හාන් රජ පෙළපතේ ආරම්භකයා, සිටියේ ය; ඔහු ඊට වඩා හොඳින් තමාගේ ම අදහස්වලට වෙනස් මත පිළිගත්තේ ය. ලි යි-චි නමැති බුද්ධිමතෙක් ලියු පාං බැලීමට ගියේ ය. ඔහුගේ පැමිණීම පළමුවෙන් දැනුම් දෙනු ලැබූ කල, ඒ කොන්පියුසියානු ගුරුකුලයේ පණ්ඩිතයෙක් විය. යුද්ධයක් පවතින බවත් පණ්ඩිතයන් හමු වීමට තමාට බැරි බවත් ලියු පාං කීවේ ය. ලි යි-චි කුපිත විය, දොරටුපාලයාට මෙසේ කීවේ යඃ ''නුඹ නැවතත් ඇතුළට ගොස් කියාපන්, මා පණ්ඩිතයෙක් නො වෙයි, කාඕයාංවලින් ආ බොන මිනිහෙක් කියලා.'' දොරටුපාලයා ඔහුට කී හැටියට කළේ ය. ''හා හොඳ යි, ඔහුට ඇතුළට එන්ට කියාපන්.'' ලි යි-චි පිවිසෙන විට, ලියු පාං සිටියේ ඔහුගේ පා සෝදමින් ය, නමුත් ඔහු ලි යි-චි සාදරයෙන් පිළිගැනීමට වහා නැගිට්ටේ ය. ලියු පාං පණ්ඩිතයකු හමුවීම ප්‍රතික්ෂේප කළ නිසා එතෙක් ම කෝපයෙන් සිටි ලි යි-චි ඔහුට හොඳට ම බැණ වැදුණේ ය. ඔහු මෙසේ කීවේ යඃ ''මේ බලනවා, ඔබට ලෝකය ජය ගන්නට වුවමනා ද, වුවමනා නැද්ද? ඔබ වැඩිහිටියකු ඔය තරම් හැල්ලු කොට සලකන්නේ මන්ද? '' ලි යි-චි එකල හැටට වැඩි විය, ලියු පාං ඊට බාල විය, එහෙයින් ලි තමාට ''වැඩිහිටියෙක්'' කියා ගත්තේ ය. ලියු පාං සමාව අයැදියේ ය, චෙන්ලියු කෝරළය අල්ලාගැනීමේ ලි යි-චිගේ සැලැස්ම

යුහු ව පිළිගත්තේ ය. මේ සිද්ධිය ''ඉතිහාසීය වාර්තා'' වෙහි ලි යි-චිගේ සහ ලූ වියාගේ ජීවිත කථාවන්හි සොයා ගත හැකි ය.

රදළ වකවානුවෙහි, ලියු පාං ඉතිහාසඥයන් විසින් ''ත්‍යාගශීලී සහ අගති විරහිත සිතක් තිබුණාවූ ද, අවවාදයට මහත් කැමැත්තෙන් කන් දුන්නාවූ ද'' වීරයකු ලෙස විස්තර කරනු ලැබී ය. ලියු පාං සහ ශියාං යූ අවුරුදු බොහෝ ගණනක් සටන් කළහ. අවසානයේදී ලියු පාං ජය ගත්තේ ය, ශියාං යූ පැරදුණේ ය. මෙය අහඹුවක් නො වී ය. අද අපේ පළමුවැනි ලේකම්වරුන් අතුරෙන් සමහරුන්ට රදළ ලියු පාංට පවා සම වෙන්නට බැරි ය, නමුත් ශියාං යූගෙන් පොඩ්ඩක් ඔවුන් තුළ තිබේ. මේ සහෝදරවරුන් වෙනස් වන්නේ නැත් නම්, ඔවුහු අන්තිමේදී පෙරළා දමනු ලබනවා ඇත. ''දුෂ්ට පාලකයා ඔහුගේ ආර්යාවට ආයුබෝවන් කියයි'' යන නමින් ගීත නාටකයක් තිබෙනවා නේ ද? මේ සහෝදරවරුන් වෙනස් නො වී සිටියොත්, ඔවුන් ද ''ඔවුන්ගේ ආර්යාවන්ට ආයුබෝවන් කියන'' දිනය එනවා ඇත. (සිනාව) කාරණය මේ තරම් සැරෙන් ඉදිරිපත් කිරීමට මට සිදු වී තිබෙන්නේ මන්ද? ටිකක් ඇණුම් පද සහිතව කතා කිරීමෙන්, සමහර සහෝදරවරුන්ට රිදවා, ඔවුන් මේ කාරණය ගැන පොඩ්ඩක් තදින් සිතා බැලීමට යොමු කරවන්නට මට හැකි වේ ය'යි මා බලාපොරොත්තු වන නිසා ය. රැයක් හෝ දෙකක් ඔවුන්ට නින්ද නොගොස් තිබෙනවා නම් ඉතා ම හොඳ ය. ඔවුන්ට නින්ද යනවා නම්, එවිට අවාසනාවන්තයා මම යි, ඔවුන්ට තව ම කිසි වේදනාවක් දැනී නැති නිසා ය.

අපේ සහෝදරවරුන් අතුරෙන් සමහරුන්ට ඔවුන්ගේ මතයට පටහැනි කිසි ම මතයක් ඇසෙන විට විඳ දරා ගන්නට බැරි ය, කිසි ම විවේචනයක් ඉවසන්නට බැරි ය. එය ඉතා වැරදි යි. මේ සම්මන්ත්‍රණය පවතින අතර, එක් පළාතක කණ්ඩායම් රැස්වීම ඉතා ප්‍රබෝධමත් අයුරකින් ආරම්භ විය, නමුත් පළාත්බද පක්ෂ කොමිටියේ ලේකම් එහි ගොස් වාඩි වූ වහා ම, නිහැඬියාවක් කඩා වැටුණේ ය, කිසිවෙක් වචනයක් වත් නො කීවේ ය, පළාත්බද පක්ෂ ලේකම් සහෝදරයා, ඔබ එහි ගොස් වාඩි වෙන්නේ කුමට ද? ඔබ ඔබගේ ම කාමරය තුළ නතර වී, ඒ ඒ දේ ගැන සිතා මතා නො බලන්නේත්, නිදහසේ කතා බහ කිරීමට අනික් අයට ඉඩ නො දෙන්නේත් මන්ද? ඔබ සිටින විට එබඳු වාතාවරණයක් ඇති වී තිබෙන හෙයින් ද, මිනිසුන් කතා කිරීමට එඩිතර නො වන හෙයින් ද, ඔබ කළ යුත්තේ නො ගොස් සිටීමයි. වැරදි කරන කවරෙක් වේවා තමා විවේචනය කළ යුතු ය; අපි අනික් අයට කතා කිරීමට ඉඩ දිය යුතු ය, අනික් අයට විවේචනය කිරීමට ඉඩ දිය යුතු ය. ගිය අවුරුද්දේ ජූනි 12 වැනි ද, චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් කැඳවන ලද පීකිං නුවර ක්‍රියාකාරක සම්මන්ත්‍රණයේ අවසාන දවසේ, මම මගේ ම අඩුපාඩු සහ වැරදි සාකච්ඡා කළෙමි. මා කී දේ පළාත්වලටත් ප්‍රදේශවලටත් දන්වන ලෙස මම සහෝදරවරුන්ගෙන් ඉල්ලුවෙමි. බොහෝ ප්‍රදේශවලට දැනුම් නො දෙනලද බව පසුව මම සොයා දැනගත්තෙමි. මගේ වැරදි සඟවා තබන්නට පුළුවන්කමක් තිබෙනවා වගේ ය, තැබිය යුතුවා වගේ ය. සහෝදරවරුනි, ඒවා සඟවා නො තිබිය යුතුයි! මධ්‍යම කාරකසභාව විසින් කරනලද සියලු වැරදි අතුරෙන්, කෙළින් ම මා හා සම්බන්ධ ඒවා ගැන වග කිව යුත්තේ මම යි, කෙළින් ම මා හා සම්බන්ධ නැති ඒවා ගැන වගකීමෙන් කොටසක් මට තිබේ, මා එහි සභාපති නිසා ය. අනික් අය ඔවුන්ගේ වගකීම ඉවත ලෑම මට වුවමනා කරනවා නො වේ-වගකීම දරන වෙන යම් යම් සහෝදරවරු ද සිටිති-නමුත් ප්‍රධාන වශයෙන් වග කියන්නට ඕනෑ තැනැත්තා මම යි. දිස්ත්‍රික්කවල, ව්‍යවසායවල සහ කොමියුන්වල පක්ෂ කොමිටි ලේකම්වරුන් තෙක් ම, අපේ පළාත්බද, ප්‍රිපෙක්චර සහ කෝරළ පක්ෂ කොමිටිවල ලේකම්වරු, පළමුවැනි ලේකම්වරුන් වීම නිසා, වැඩවල තිබෙන අඩුපාඩු සහ වැරදි ගැන වගකීම දැරිය යුතු ය.

අයකු පස්සපැත්තට අත තබන්නට කිසිවකු එඩිතර නො වන කොටියකු වන්නාක් මෙන් වගකීම පැහැර හැරීම, ඊට උර දීමට බිය වීම සහ කට ඇර කතා කිරීම මිනිසුන්ට තහනම් කිරීම-මේ ආකල්පය වැළඳගන්නා දහ දෙනෙකුන්ගෙන් දහ දෙනෙකුන්ට ම වරදිනවා ඇත. මිනිස්සු හැම විට ම කවද හරි කට ඇර කතා කරනවා ඇත. මිනිස්සු ඇත්ත වශයෙන් ඔබ වැනි කොටින්ගේ පස්සාපැතිවලට අත තබන්නට එඩිතර නො වෙති'යි ඔබ සිතනවාද? ඔවුන් තබන එක තබනවා මයි!

අප මහජන ප්‍රජාතන්ත්‍රවාදය සහ පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් දියුණු කළ හොත් මිසක්, අප නිර්ධනපංක්ති ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ හොත් මිසක් සැබෑ නිර්ධනපංක්ති මධ්‍යගතවාදය ඇති කර ගන්නට චීනයට බැරි වෙනවා ඇත. ඉහළ ප්‍රමාණයක ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව ඉහළ ප්‍රමාණයක මධ්‍යගතවාදය ඇති වෙන්නට බැරි ය, ඉහළ ප්‍රමාණයක මධ්‍යගතවාදය නොමැතිව සමාජවාදී ආර්ථිකයක් පිහිටුවන්නට බැරි ය. සමාජවාදී ආර්ථිකයක් පිහිටුවීමට අප අසමත් වුව හොත් අපේ රටට කුමක් සිදු වෙනවා ඇද්ද? එය සංශෝධනවාදී රාජ්‍යයක්, සත්තකින් ම ධනේශ්වර රාජ්‍යයක්, බවට හැරෙනවා ඇත; නිර්ධනපංක්තියේ ආඥාදායකත්වය ධනේශ්වරපංක්තියේ ආඥාදායකත්වයක්, එපමණක් නො ව, ප්‍රතිගාමී ෆැසිස්ට් ආඥාදායකත්වයක්, බවට හැරෙනවා ඇත. මෙය අපේ සෝදිසිමත් බව යොමු වීමට බෙහෙවින් ම සුදුසු ප්‍රශ්නයකි, අපේ සහෝදරවරුන් ඒ ගැන හොඳට කල්පනා කර බලනවා ඇතැ' යි මම බලාපොරොත්තු වෙමි.

ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය නොමැති ව, නිර්ධනපංක්තියේ ආඥාදායකත්වය තහවුරු නො කළ හැකි ය. ජනතාව අතර ප්‍රජාතන්ත්‍රවාදය භාවිතාවේ යෙදීම සහ ජනතාවගේ සතුරන් කෙරෙහි ආඥාදායකත්වය ක්‍රියාවේ

යෙදීම-මේ පැති දෙක වෙන් නො කළ යුතු ය. ඒවා බද්ධ කළ විට, නිර්ධනපංක්ති ආඥාදායකත්වය නැතහොත් මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය ය'යි කිව හැකි දෙය, අපට ලැබේ. අපේ සටන්පාඨය: ''නිර්ධනපංක්තිය විසින් නායකත්වය දෙනු ලබන, කම්කරුවන්ගේ සහ ගොවියන් ගේ සන්ධානය පදනම කර ගත්, මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයක්'' යන්න යි. නිර්ධනපංක්තිය ආඥාදායකත්වය ක්‍රියාවේ යොදන්නේ කෙසේ ද? එය නායකත්වය දෙන්නේ කොමියුනිස්ට් පක්ෂය තුළින් ය. කොමියුනිස්ට් පක්ෂය නිර්ධනපංක්තියේ පෙරමුණු-ඇණිය යි. නිර්ධනපංක්තිය සමාජවාදී විප්ලවයට සහ සමාජවාදී සංවර්ධනයට පක්ෂ වන, අනුබල දෙන සහ සහභාගි වන සියලු පංක්ති සහ තට්ටු සමග එක්සත් වී, ප්‍රතිගාමී පංක්ති කෙරෙහි, නැතහොත් ඒ පංක්තිවලින් ඉතිරි වී සිටින කොටස් කෙරෙහි, ආඥාදායකත්වය ක්‍රියාවේ යොදයි. මිනිසා විසින් මිනිසා සූරාකෑමේ ක්‍රමය දැනට ම විනාශ කර දමා තිබෙන, ඉඩම්හිමි පංක්තියේත් ධනේශ්වරපංක්තියේත් ආර්ථික පදනම උදුරා දමා තිබෙන, අපේ රටෙහි ප්‍රතිගාමී පංක්ති තවදුරටත් අතීතයේදී මෙන් භයානක නො වෙත්. උදාහරණ වශයෙන්, මහජන සමූහාණ්ඩුව ආරම්භ කළ 1949 දී හෝ ධනේශ්වර දක්ෂිණවාදීන් අපට වියරු ලෙස පහර දුන් 1957 දී හෝ ඔවුන් භයානක වූ තරම් ම මේ කාලයේත් ඔවුහු භයානක නො වෙති. එහෙයින් අපි ඔවුන් ගැන ප්‍රතිගාමී පංක්තිවලින් ඉතිරි වී සිටින කොටස් වශයෙන් කතා කරමු. එහෙත් කිසි ම අවස්ථාවක අපි මේ ඉතිරි වී සිටින කොටස් අඩුවෙන් තක්සේරු නො කළ යුත්තෙමු. අපි ඔවුන්ට විරුද්ධව අපේ අරගලය දිගට ම ගෙන යා යුත්තෙමු. පෙරළා දමනු ලැබ සිටින ප්‍රතිගාමී පංක්ති තව මත් ආපසු බලයට එන්නට මාන බලති. සමාජවාදී සමාජයෙහි අළුත් ධනේශ්වර කොටස් දිගට ම පහළ වෙති. පංක්ති සහ පංක්ති සටන සමාජවාදී අවස්ථාව මුළුල්ලේ ම පවතී. මේ අරගලය දීර්ඝ ය, සංකීර්ණ ය, ඇතැම් විට ඉතා උග්‍ර ද වේ. අපේ ආඥාදායකත්වයේ උපරකණ ශක්තිමත් කළ යුතු ය, දුර්වල නො කළ යුතු ය. අපේ මහජන ආරක්ෂා ක්‍රමය තිබෙන්නේ නිවැරදි ක්‍රියාමාර්ගය අනුගමනය කරන සහෝදරවරුන් අතේ ය. එහෙත් එක් තැනක හෝ වෙන තැනක ආරක්ෂක කාර්යාංශ නරක මිනිසුන් අතේ පවතින්නට පුළුවන්කම තිබේ. බහුජනයා මත හෝ පක්ෂය මත හේත්තු නො වන මහජන ආරක්ෂක වැඩ කරන සහෝදරවරු ද සුළු ගණනක් සිටිති. ප්‍රතිවිප්ලවවාදීන් සොයා එළියට ඇද ගැනීමේ දී ඔවුහු පක්ෂ කොමිටිවල නායකත්වය යටතේ බහුජනයා තුළින් වැඩ කරන ක්‍රියාමාර්ගය අනුගමනය නො කරති, රහස් වැඩ මත පමණක්, වෘත්තීය වැඩ ය'යි කියන වැඩ මත පමණක්, හේත්තු වෙති. වෘත්තීය වැඩ අවශ්‍ය ය; ප්‍රති-විප්ලවවාදීන් ගැන ක්‍රියා කරන විට පරීක්ෂා කිරීමත් ප්‍රශ්න කිරීමත් ඒකාන්තයෙන් ම අවශ්‍ය ය. එහෙත් ඉතා ම වැදගත් දෙය පක්ෂ කොමිටියේ නායකත්වය යටතේ බහුජන ක්‍රියාමාර්ගය අනුගමනය කිරීම යි. මුළු එකක් වශයෙන් ප්‍රතිගාමී පංක්ති කෙරෙහි ආඥාදායකත්වය ක්‍රියාවේ යෙදීමේදී බහුජනයා මත සහ පක්ෂය මත හේත්තු වීම විශේෂයෙන් ම අවශ්‍ය ය. ප්‍රතිගාමී පංක්ති කෙරෙහි ආඥාදායකත්වය යන්නෙන් සියලු ප්‍රතිගාමී පංක්ති කොටස් කායික වශයෙන් නැති කර දැමීම අදහස් නො වේ. අරමුණ ඔවුන් අළුතෙන් හැඩ ගැසීම ය, උචිත ක්‍රම මගින් ඔවුන් අළුතෙන් හැඩගැසීම, ඔවුන් අළුත් මිනිසුන් බවට තැනීම ය. ජනතාව සඳහා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව, නිර්ධනපංක්තියේ ආඥාදායකත්වය තහවුරු කිරීමට හෝ දේශපාලන බලය ස්ථාවර වීමට හෝ නොහැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව, බහුජනයා අවදි කරන්නේ නැතිව, බහුජනයා විසින් කැරෙන පරීක්ෂණය නොමැතිව ප්‍රතිගාමීන් හා නරක කොටස් කෙරෙහි සාර්ථක ලෙස ආඥාදායකත්වය ක්‍රියාවේ යෙදීමට හෝ ඔවුන් සාර්ථක ලෙස අළුතෙන් හැඩගැසීමට හෝ නො හැකි ය; ඔවුන් දිගට ම කරදර ඇති කරනවා ඇත, ආපසු බලයට ඒමක් සංවිධානය කොට කැරලි ගැස්සීමට ඉඩ ඇත. අපි මේ ප්‍රශ්නය ගැන සෝදිසිමත් විය යුත්තෙමු, සහෝදරවරුන් එගැන හොඳට හිතා මතා බලනවා ඇතැ'යි මම බලාපොරොත්තු වෙමි.

**තුන්වැනි කරුණ: අප එක්සත් විය යුත්තේ කොයි පංක්ති සමග ද, අප මර්දනය කළ යුත්තේ කොයි පංක්ති ද? මෙය ගන්නා මූලික මග පිළිබඳ ප්‍රශ්නයකි.**

කම්කරු පංක්තිය එක්සත් විය යුත්තේ ගොවි ජනතාව, නාගරික සුළු ධනේශ්වර පංක්තිය සහ දේශප්‍රේමී ජාතික ධනේශ්වර පංක්තිය සමග ය, පළමුවෙන් ම ගොවි ජනතාව සමග ය. විද්‍යාඥයන්, ඉංජිනේරුවන් හා ශිල්පඥයන්, මහාචාර්යවරුන්, ගුරුවරුන්, ලේඛකයන්, චිත්‍රශිල්පීන්, නළු නිළියන්, වෛද්‍ය සේවකයන් සහ පුවත්පත්කලාවේදීන් වැනි බුද්ධිමත්හු පංක්තියක් වශයෙන් සලකනු නො ලබති; ඔවුහු එක්කෝ ධනේශ්වර පංක්තියට, නැත්නම් නිර්ධන පංක්තියට ඇඳී සිටිති. අප එක්සත් විය යුත්තේ විප්ලවවාදී වන්නාවූ බුද්ධමතුන් සමග පමණක් ද? නැත. බුද්ධිමත්හු යම්තාක් කල් දේශප්‍රේමී වෙත් ද ඒ තාක් කල් අපි ඔවුන් සමග එක්සත් වන්නෙමු, ඔවුන්ගේ වැඩ හොඳින් කිරීමට ඔවුන්ට ආධාර කරන්නෙමු. කම්කරුවන්, ගොවියන්, නාගරික සුළු ධනේශ්වර කොටස් දේශප්‍රේමී බුද්ධිමතුන්, දේශප්‍රේමී ධනපතියන් සහ සෙසු දේශප්‍රේමී ප්‍රජාතන්ත්‍රවාදියෝ එකතු වූ කල ජනගහනයෙන් සියයට 95 කට වඩා අඩංගු කර ගනිති. අපේ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය යටතේ, ඔවුන් සියලු දෙනා ම අයත් වන්නේ ජනතාවගේ ගණයට ය. ජනතාව අතර අප භාවිතා කළ යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදය යි.

මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය විසින් මර්දනය කළ යුත්තෝ ඉඩම්හිමියන්, පොහොසත් ගොවියන්, ප්‍රති-විප්ලවවාදීන්, නරක කොටස් සහ කොමියුනිස්ට්-විරෝධී දක්ෂණවාදියෝ ය. ප්‍රති-විප්ලවවාදීන්, නරක කොටස් සහ කොමියුනිස්ට්-විරෝධී දක්ෂිණවාදියෝ ඉඩම්හිමි පංක්තිය සහ ප්‍රතිගාමී ධනේශ්වර පංක්තිය නියෝජනය කරති. මේ පංක්ති සහ නරක මිනිස්සු ජනගහනයෙන් සියයට 4 ක් 5 ක් පමණ අඩංගු කර ගනිති. අළුතෙන් හැඩගැසීමට භාජන වන ලෙස අප විසින් බල කළ යුත්තෝ ඔවුහු ය. මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයේ විෂයය වන්නෝ ඔවුහු ය.

අප නැගී සිටින්නේ කා සමග ද? ජනගහනයෙන් සියයට 95 ක් අඩංගු කර ගන්නාවූ බහුජනයා සමග ද? නැතහොත් ජනගහනයෙන් සියයට 4 ක් හෝ 5 ක් අඩංගු කර ගන්නාවූ ඉඩම්හිමියන්, පොහොසත් ගොවියන්, ප්‍රති-විප්ලවවාදීන්, නරක කොටස් සහ දක්ෂිණවාදීන් සමග ද? අප ගත යුත්තේ ජනතාවගේ පැත්ත ය, කිසි විටෙක ඔවුන්ගේ සතුරන්ගේ පැත්ත නො වේ. මාක්ස්-ලෙනින්වාදියෙකු හට මෙය ගන්නා වූ මූලික මග පිළිබඳ ප්‍රශ්නයකි.

මෙය අපේ රට ඇතුළත සැබෑ වන්නා සේ ම, එය ජාත්‍යාන්තර වශයෙන් ද සැබෑ වන්නේ ය. කවද හරි, සියලු රටවල්වල ජනතාවට, ලෝකයේ ජනගහනයෙන් සියයට 90 කට වඩා අඩංගු කර ගන්නාවූ බහුජනයාට, විප්ලවය වුවමනා වෙනවා ඇත, ඔවුන් මාක්ස්-ලෙනින්වාදයට අනුබල දෙනවා ඇත. ඔවුන් සංශෝධනවාදයට අනුබල දෙන්නේ නැත; සමහර අය ටික කලකට ඊට අනුබල දුන්නත්, ඔවුන් අන්තිමේදී එය පැත්තකට විසිකරනවා ඇත. ඔවුන් අනුක්‍රමයෙන් අවදි වෙනවා නියත ය, ඔවුන් අධිරාජ්‍යවාදයට හා ප්‍රතිගාමීත්වයට විරුද්ධ වෙනවා නියත ය, ඔවුන් සංශෝධනවාදයට විරුද්ධ වෙනවා නියත ය. සැබෑ මාක්ස්-ලෙනින්වාදියෙක් ලෝකයේ ජනගහනයෙන් සියයට 90 කට වඩා අඩංගු කර ගන්නාවූ බහුජනයාගේ පැත්ත ගෙන ස්ථිර ලෙස නැගී සිටිය යුතු ය.

**සිව්වැනි කරුණ: විෂයමූල ලෝකය තේරුම් ගැනීම.**

විෂයමූල ලෝකය පිළිබඳ මිනිසාගේ අවබෝධයට, අවශ්‍යතාවේ රජදහනේ සිට නිදහසේ රජදහනට ඔහු පනින පිම්මට, ක්‍රියාදාමයක් පටලැවී ඇත. නිදසුන් වශයෙන්, චීනයෙහි ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය කරගෙන යන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ගන්න. අපේ පක්ෂය මේ ප්‍රශ්නය ගැන අවබෝධයේ පූර්ණ ඒකත්වයට එළඹීමට පෙර, 1921 දී එහි ආරම්භයේ සිට 1945 දී එහි හත්වැනි සම්මේලනය තෙක් 24 අවුරුද්දක් ගත විය. මේ වකවානුව තුළ අපි 1942 වසන්තයේ සිට 1945 ග්‍රීෂ්ම ඍතුව තෙක් පැවති පක්ෂ-ව්‍යාප්ත පරිශෝධන ව්‍යාපාරයකට භාජන වීමු. එය කෙළවරට ම ගිය ව්‍යාපාරයක් විය; යොදනලද්දේ ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රමයයි; ඒ කියන්නේ, වැරදි කර තිබුණේ කවරකු වුව ද, ඔහු ඒ වැරදි පිළිගෙන නිවැරදි කර ගත්තේ නම් සියල්ල හරි විය. එමතු නො ව, ඒ වැරදි පිළිගෙන නිවැරදි කර ගැනීමට හැමෝ ම ඔහුට ආධාර කළහ. මෙය ''අනාගත වැරදිවලින් වැළැකී සිටීම පිණිස අතීත වැරදිවලින් පාඩම් ඉගෙනගැනීම සහ ලෙඩා බේරාගැනීම පිණිස රෝගය සුව කිරීම'' හෝ ''සමගිය පිණිස අභිලාෂයෙන් පටන් ගැනීම, විවේචනය හෝ අරගලය තුළින් වැරදි දෙයින් හරි දෙය වෙන් කොට හඳුනාගැනීම සහ, අළුත් පදනමක් මත අළුත් සමගියක් කරා පැමිණීම'' ය'යි කියනු ලැබී ය. ''සමගිය-විවේචනය-සමගිය'' යන සූත්‍රය ඇති වූයේ ඒ කාලයේ ය. පරිශෝධන ව්‍යාපාරය අවබෝධයේ ඒකත්වය කරා එළඹීමට මුළු පක්ෂයේ ම සාමාජිකයන්ට ආධාර කළේ ය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ගෙන යා යුත්තේ කෙසේ ද, පක්ෂයේ සාමාන්‍ය ක්‍රියාමාර්ගය සහ එහි විශේෂ ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ කෙසේ ද යන ප්‍රශ්න සම්පූර්ණයෙන් ම විසඳනු ලැබුවේ ඒ වකවානුවේදී ය, විශේෂයෙන් පරිශෝධන ව්‍යාපාරයට පසුව ය.

පක්ෂයේ ආරම්භයත් ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධයත් අතර වකවානුව තුළ, අපට උතුරු යුදගමන සහ දස අවුරුදු ඉඩම් ලබා ගැනීමේ විප්ලවවාදී යුද්ධය තිබුණේ ය. අපි ජයග්‍රහණ දෙකක් දිනා ගත්තෙමු, පරාජයන් දෙකකට භාජනය වීමු. උතුරු යුද ගමන ජයග්‍රාහී විය. එහෙත් 1927 දී විප්ලවය පරාජයක් වින්දේ ය. ඉඩම් ලබා ගැනීමේ විප්ලවවාදී යුද්ධයේදී සුවිශිෂ්ට ජයග්‍රහණ අත් කර ගනු ලැබී ය, රතු හමුදාව 3,00,000 ක ශක්තියකට වැඩුණේ ය. එහෙත් පසු ව අපි යළිත් පරාජයන්ට භාජන වීමු, 3,00,000 ක් වූ අපේ හමුදාව දීර්ඝ පා-ගමනේදී හුදෙක් 20,000 ගණනකට අඩු විය. එය උතුරු ශෙන්සි පළාතට සේන්දු වූ පසු, අළුත් භටයන් වගයක් ඇතුළත් කර ගත් නමුත් එතෙක් ම 30,000 කට වඩා අඩු විය, එනම්, මුලින් වූ 3,00,000 යෙන් දහයෙන් එකකට වඩා අඩු විය. ඒ කෙසේ වෙතත්, වඩා ශක්තිමත් වූයේ කුමක් ද, 3,00,000 හමුදාව ද, නැතහොත් 30,000 කට අඩු වූ හමුදාව ද? 30,000 කට අඩු වූ හමුදාව ය, ඒ බරපතල පරාජයන් විඳ දරාගෙන, ඒ අන්ත දුෂ්කරතා තුළින් ගිය අප පන්නරය තබාගෙන සහ අත්දැකීම් ලබාගෙන වැරදි ක්‍රියාමාර්ගය පරිශෝධනය කර සහ නිවැරදි ක්‍රියාමාර්ගය ප්‍රතිස්ථාපනය කර, සිටි නිසා ය. පසුගිය සිව් වසර තුළ අපේ ක්‍රියාමාර්ගය නිවැරදි වූ නිසා සහ අපේ ජයග්‍රහණ මූලික වූ නිසාත්, අපේ ප්‍රායෝගික වැඩවලදී වැරදි කිරීම තුළින් සහ ඒවායින් පීඩා විඳීම තුළින් අප අත්දැකීම් ලබා සිටින නිසාත්, අප, වඩා දුර්වල නො ව වඩා ප්‍රබල වී සිටින බව මේ සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළ වාර්තාවෙහි කියා ඇත. මේ කරුණු හරියට ම තිබෙන සැටි ය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිළිබඳ වකවානුවෙහි, අප චීනයේ මේ විෂයමූල ලෝකය අවබෝධ කර ගැනීමට යෙදුණේ අප ජයග්‍රහණය, ඉක්බිති යළිත් පරාජය, අත්දැකීමෙන් පසුව පමණි, අප දෙ වතාවක් ම සංසන්දනය කිරීමෙන් පසු ව පමණි, ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය පටන් ගන්නා ළඟදී සහ ඒ යුද්ධය කරගෙන යන අතර මම **චීනයේ විප්ලවවාදී යුද්ධයෙහි උපායමාර්ගය පිළිබඳ ප්‍රශ්න, දිග්ගැස්සුණු යුද්ධය ගැන, නව ප්‍රජාතන්ත්‍රවාදය ගැන** සහ **''කොමියුනිස්ට්වාදියා'' හඳුන්වා දීම** වැනි නිබන්ධ ගණනක් ලීවෙමි, මම මධ්‍යම කාරකසභාව සඳහා ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය ගැන ලියවිලි ගණනක් කෙටුම්පත් කළෙමි. ඒ සියල්ල විප්ලවවාදී අත්දැකීම් සම්පිණ්ඩනය කරයි. මේ නිබන්ධ සහ ලියවිලි හැකි වූයේ ඒ කාලයේ පමණි, ඊට පෙර නො වේ; ඒ වන තුරු අප කලබල හා කරදර තුළින් නො ගොස් සිටි නිසා සහ අපේ ජයග්‍රහණ දෙකත් පරාජයන් දෙකත් සංසන්දනය කිරීමට අපට නුපුළුවන් වූ නිසා ය; එහෙයින් අප ප්‍රමාණවත් පරිදි අත්දැකීම් නො ලබා සිටි නිසා සහ චීන විප්ලවය පාලනය කරන නියාමයන් සම්පූර්ණයෙන් තේරුම් ගැනීමට අපට නුපුළුවන් වූ නිසා ය.

සාමාන්‍යයෙන් කියන කළ, චීනයේ විෂයමූල ලෝකය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සමත්වූවෝ චීන ජාතිකයෝ ය, චීන ප්‍රශ්න ගැන ක්‍රියා කළ කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ සහෝදරවරු නො වෙත්. කොමියුනිස්ට් ජාත්‍යන්තරයෙහි සිටි මේ සහෝදරවරු චීන සමාජය, චීන ජාතිය සහ චීන විප්ලවය තේරුම් නො ගත්හ - නැතහොත් ඔවුහු ඒවා හොඳින් තේරුම් නො ගත්හ'යි අප විසින් කිව හැකි ය. බොහෝ කලක් ම විෂයමූල ලෝකයක් වශයෙන් චීනය ගැන පැහැදිලි අවබෝධයක් ලැබීමට අපි ම අසමත් වීමු, විදේශීය සහෝදරවරුන් ගැන කිව යුතු නොවේ.

ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය පිළිබඳ වකවානුව වන තුරු ම අපි පක්ෂය සඳහා පැතිරී පැවැති තත්ත්වයන්ට යෝග්‍ය වූ සාමාන්‍ය ක්‍රියාමාර්ගයක් සහ විශේෂ ප්‍රතිපත්ති මුළු තොගයක් සකස් නො කළෙමු. එවිට පමණකි අප චීන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, මේ අවශ්‍යතාවේ රජදහන, තේරුම් ගැනීමට යෙදුණේත්, අප නිදහස ලබා ගත්තේත්, ඒ කාලය වන විට, අප අවුරුදු විසි ගණනක් ම විප්ලවය කර තිබුණේ ය. ඒ අවුරුදු මුළුල්ලේ ම අපේ විප්ලවවාදී වැඩවල සැලකිය යුතු ප්‍රමාණයක අන්ධභාවයක් තිබුණේ ය. යම්කිසි සහෝදරයෙක් - නිදසුන් වශයෙන්, මධ්‍යම කාරකසභාවේ යම්කිසි සහෝදරයෙක්, නැතහොත් සත්තකින් ම මම ම වුවත් - ආරම්භයේ සිට ම චීන විප්ලවය පාලනය කරන නියාමයන් සම්පූර්ණයෙන් තේරුම් ගත්තේ ය'යි යමෙක් කියා සිටී නම්, එසේ නම් ඔහු පුරසාරම් කියන්නෙකි, ඔබ කිසි ම හේතුවක් නිසා ඔහු විශ්වාස නො කළ යුතු ය. එය එසේ වුණේ නැත. අතීතයේදී, විශේෂයෙන් මුල් අවුරුදුවල, අප හැමෝට ම තිබුණේ විප්ලවය කෙරෙහි අනුරතියකි, එහෙත් විප්ලවය කරන්නේ කෙසේ ද, ඉලක්ක වූයේ මොනවා ද, මුලට ආ යුත්තේ කොයි ඉලක්ක ද, පසුවිය යුත්තේ කොයි ඒවා ද, ඊළඟ අවස්ථාව වන තුරු බලා සිටීමට තිබුණේ කොයි ඒවා ද, යන ප්‍රශ්නවලට පැමිණි කල, අපට තරමක් දිගු කලක් යන තුරු, පැහැදිලි , නැතහොත් යටත්පිරිසෙයින් සම්පූර්ණයෙන් ම පැහැදිලි, අදහස් තිබුණේ නැත.

චීන කොමියුනිස්ට් පාක්ෂිකයන් වන අප, ඉතා අමාරුවෙන් වුවත් සාර්ථක ලෙස, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිළිබඳ වකවානුවේදී චීන විප්ලවය පාලනය කරන නියාමයන් දැනගැනීමට යෙදුණේ කෙසේ ද'යි ඉතිහාසීය විස්තරයක් දීමෙන් මා බලාපොරොත්තු වන්නේ සහෝදරවරුන්ට එක් දෙයක් තේරුම් ගැනීම කරා මග පෙන්වීමට ය. සමාජවාදය ගොඩනැගීම පාලනය කරන නියාමයන් දැනගැනීමට පුළුවන්වීමත් ක්‍රියාදමයක් පටලවා ගන්නා බව ය. අපි භාවිතාව පටන්ගන්නා- තැන වශයෙන් ගෙන, අත්දැකීමක් නො තිබීමේ සිට කිසියම් අත්දැකීමක් තිබීම කරා, ටිකක් අත්දැකීම තිබීමේ සිට වැඩියෙන් අත්දැකීම තිබීම කරා, සමාජවාදය, මේ තව ම නො දන්නා අවශ්‍යතාවේ රජදහන, ගොඩනැගීමේ සිට නිදහසේ රජදහන, දැනගැනීමෙහි පිම්මක් - අපේ අන්ධභාවය අනුක්‍රමයෙන් මැඩපැවැත්වීම තුළින් සහ විෂයමූල නියාමයන් අනුක්‍රමයෙන් තේරුම් ගැනීම තුළින් නිදහස අත් කර ගැනීම - කරා ප්‍රේරණය විය යුත්තෙමු.

අපට තව ම සමාජවාදය ගොඩනැගීමෙහි ලා අත්දැකීම් අඩු ය. රටවල් කීපයකින් පැමිණි සහෝදර පක්ෂවල නියෝජිත පිරිස් සමග මා මේ ප්‍රශ්නය සාකච්ඡා කර ඇත. සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීමෙහි ලා අපට අත්දැකීම් නොමැති බව මම ඔවුන්ට කීවෙමි.

මම මේ ප්‍රශ්නය ධනවාදී රටවල්වලින් පැමිණි පුවත්පත්කලාවේදීන් වගයක් සමග ද සාකච්ඡා කළෙමි, ඔවුන් අතර එඩ්ගාර් ස්නෝ නමැති ඇමෙරිකන් ජාතිකයෙක් ද විය. බොහෝ කල් සිට ම චීනයට එන්නට ඔහුට වුවමනා වී තිබුණේ ය. 1960 දී අපි ඔහුට ඉඩ දුනිමු. මම ඔහු සමග සල්ලාපයක යෙදුනෙමි. මම මෙසේ කිවෙමි: ''ඔබ දන්නා පරිදි, අපට දේශපාලනය, යුද්ධ කටයුතු සහ පංක්ති සටන සම්බන්ධයෙන් අත්දැකීම් තොගයක්, මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර තොගයක් තිබේ; එහෙත් සමාජවාදී සංවර්ධනයට එන විට, අප අතීතයේදී කිසිවක් කර තිබුණේ නැත, අපට තව ම අත්දැකීම් නැත. 'ඇයි ඔබ 11 අවුරුද්දක් ම එහි යෙදී සිටියේ නැද්ද?' යි ඔබ කියන්නට ඉඩ තිබේ. ඔව් ඇත්ත, අප යෙදී සිටියා, එහෙත් තව ම අපට දැනුමත් අත්දැකීමත් අඩු යි. අප ටිකක් ලබා ගැනීමට පටන් ගනිමින් සිටිතත්, එය එතරම් දෙයක් නො වේ'' චීනයේ දීර්ඝකාලීන සංවර්ධන සැලැස්ම ගැන මා කිසිවක් කීම ස්නෝට වුවමනා කළේ ය . ''මා දන්නේ නැහැ'' යි මම කීවෙමි, ''ඔබ පමණට වඩා පරෙස්සම් වෙනවා,'' යි ඔහු කිවේ ය. ''එය පරෙස්සම් වීම පිළිබඳ ප්‍රශ්නයක් නො වේ. මා ඇත්තට ම දන්නේ නැහැ, අපට අත්දැකීම් ඇත්තේ ම නැහැ,'' යි මම පිළිතුරු දුනිමි. සහෝදරවරුනි, අප නොදන්නා බව, අපට තව ම අත්දැකීම් හිඟ බව සහ එබඳු දීර්ඝ-කාලීන සැලැස්ම තව ම ඇත්ත වශයෙන් නැති බව ඇත්ත ය. නවසිය හැට අප දුෂ්කරතා ගොඩකට අසුවූ වර්ෂය ම විය. 1961 දී මම මොන්ට්ගොමරි සමග සාකච්ඡාවකදී යළිත් මේ දේ ගැන කතා කළෙමි. ''තව අවුරුදු 50 කින් ඔබ හරි ම භයානක වෙනවා ඇත,'' යි ඔහු කීවේ ය. ඔහු අදහස් කළේ අවුරුදු 50 කට පසු අප බලවත් වෙනවා ඇත, අන්‍යයන් කෙරෙහි ''ආක්‍රමණශීලී'' වෙනවා ඇත, ඊට කලින් නොවේ, කියා ය. ඔහු 1960 දී චීනයෙහි සිටියදීත් මේ අදහස මා සමග පවසා තිබුණේ ය. මම මෙසේ කීවෙමි: ''අපි මාක්ස්-ලෙනින්වාදියෝ වෙමු, අපේ වනාහි සමාජවාදී රාජ්‍යයකි, ධනවාදී රාජ්‍යයක් නො වේ, එහෙයින් අපි අවුරුදු 100 කින් වේවා, අවුරුදු 10,000 කින් වේවා, අන්‍යයන්ට විරුද්ධ ව ආක්‍රමණය නො කරමු. චීනයෙහි බලවත් සමාජවාදී ආර්ථිකයක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්, අවුරුදු 50 ක් ප්‍රමාණවත් නො වේ, එය අවුරුදු 100 ක් හෝ ඊටත් වඩා ගන්නවා ඇත. ඔබගේ ම රටේ ධනවාදයේ වර්ධනය අවුරුදු සිය ගණනක් ගෙන ඇත. අපි 16 වැනි සියවස ගණන් නො ගනිමු, එතෙක් මධ්‍ය යුග අවසන් වී නොතිබුණු හෙයිනි. එහෙත් 17 වැනි සියවසේ සිට වර්තමානය තෙක් දැනට ම අවුරුදු 360 කට වැඩි ය. අපේ රටෙහි, බලවත් සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීම අවුරුදු 100 කට වඩා ගන්නවා ඇතැ,'යි මම කල්පනා කරමි.'' 17

වැනි සියවස කවර වකවානුවක වී ද? එය මිං රජ පෙළපතේ අවසානය සහ චිං රජ පෙළපතේ ආරම්භය විය. අප 18 වැනි සියවසේ මුල භාගයට, නැතහොත් **රතු කාමරයේ සිහිනයේ** කර්තෘ ත්සාඕ ශුවේ-චින් ජීවත් වූ වකවානුව වූ, රදළ ක්‍රමය ගැන නො සෑහීමට පත්ව සිටි චියා පාඕ-යූ වැනි කල්පිත චරිතයන්ට උපත දුන් වකවානුවක් වූ, චිං රජ පෙළපතේ චියන් ලුං වකවානුවට එන්නට පෙර තවත් සියවසක් ගත විය යුතු විය. චියන් ලුං වකවානුවෙහි, ධනවාදී නිෂ්පාදන සබඳතාවන්ගේ අංකුර ඒ වන විටත් චීනයේ පැවතුණේ ය, එහෙත් එය රදළ සමාජයක් ම වී පැවතුණේ ය. තාකුවාන් උයනෙහි කල්පිත චරිත සමූහයාගේ බිහිවීම පිළිබඳ සමාජ පසුබිම එබඳු ය. මීට කලින්, 17 වැනි සියවසෙහි, ධනවාදය ඒ වන විටත් යුරෝපීය රටවල් ගණනක වර්ධනය වෙමින් තිබුණේ ය. ධනවාදී නිෂ්පාදන බලවේගයන් ඔවුන්ගේ වර්තමාන තත්ත්වයට වර්ධනය වීම පිණිස අවුරුදු 300 කට වඩා ගෙන ඇත. සමාජවාදය ධනවාදයට වඩා බෙහෙවින් ශ්‍රේෂ්ඨ ය. අපේ ආර්ථිකය ධනවාදී රටවල්වල ආර්ථිකයන්ට වඩා සීඝ්‍රයෙන් සංවර්ධනය වෙනවා ඇත. එහෙත් චීනයට විශාල ජනගහනයක් ඇත. පටන් ගැනීමට තිබුණේ ස්වල්ප දෙයකි, ආර්ථික වශයෙන් නොදියුණු ය, එහෙයින් මගේ මතය අනුව ඇට අවුරුදු 100 කට අඩු කලක් තුළ ලෝකයේ ඉතා ම දියුණු ධනවාදී රටවල්වලට කිට්ටු කොට ඒවා පසු කර යන සේ නිෂ්පාදක බලවේගයන්ගේ සුවිශාල ව්‍යාප්තියක් ඇති කර ලිය නො හැකි ය. බාග විට එය ඇත්ත වශයෙන්, ඇතැම් මිනිසුන් කල්පනා කරන පරිදි, දශක කීපයක් පමණක්-අවුරුදු 50 ක් ය'යි කියමු-ගන්නවා ඇත. එය ඒ විධියට සිදු වෙනවා නම් අපි අහසට පොළොවට ස්තුති කරමු, එය ඉතා අසිරිමත් වෙනවා ඇත! එහෙත් දුෂ්කරතා වැඩියෙන් බලාපොරොත්තු වෙන ලෙසත්, එහෙයින් ඊට වඩා තරමක් දිග වකවානුවක් ගැන කල්පනා කරන ලෙසත් සහෝදරවරුන්ට අවවාද කිරීමට මම කැමැත්තෙමි. බලවත් ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීමට අවුරුදු 300 කට වඩා ගත විය; අපේ රටෙහි බලවත් සමාජවාදී ආර්ථිකයක් අවුරුදු 50 කින් 100 කින් පමණ ගොඩනැගීමෙහි තිබිය යුතු වරද කුමක්ද? දැන් සිට පටන් ගනිමින්, මීළඟ අවුරුදු 50 සිට 100 පමණ තෙක් කාලය ලොව මුළුල්ලෙහි සමාජ ක්‍රමයෙහි මූලික වෙනසක් පිළිබඳ ශ්‍රේෂ්ඨ යුගයක්, පෙර කිසි ම ඉතිහාසීය වකවානුවක ඊට සමාන වූවක් නොමැති මිහිකත කම්පා කරන යුගයක්, වෙනවා ඇත. එබඳු යුගයක ජීවත් වෙන අපි ආකාරයෙන් අතීතයෙහි කළ අරගලවල අංගලක්ෂණයන්ට වඩා වෙනස් බොහෝ අංගලක්ෂණ තිබෙන අතිවිශාල අරගලවල යෙදීමට සූදානම් වී සිටිය යුත්තෙමු. අප බාරගන්නා මේ කටයුත්තේදී, අපි මාක්ස්-ලෙනින්වාදය නමැති විශ්ව සත්‍යය චීනයේ සමාජවාදී සංවර්ධනයේ වාස්තවික යථාතත්ත්වයන් සමගත්, දැන් සහ අනාගතයෙහි ලෝක විප්ලවයේ වාස්තවික යථාතත්ත්වයන් සමගත් හැකි ඉතා ම හොඳ පිළිවෙළට ඒකීභූත කළ යුත්තෙමු. භාවිතාව තුළින්, අරගලයේ විෂය මූල නියාමයන් අනුක්‍රමයෙන් දැනගත යුත්තෙමු. අපි අපේ අන්ධභාවයේ ප්‍රතිඵලය වශයෙන් ඇති වන බොහෝ ව්‍යර්ථභාවයන් සහ බාධාවන් විඳින්නට සූදානම් වී සිටිය යුත්තෙමු, එමගින් අත්දැකීම් ලබාගෙන, අවසාන ජයග්‍රහණය දිනා ගත යුත්තෙමු. අප මේ අන්දමට ඒ ඒ දේ දකින කල, වඩා කෙටි වකවානුවක් ගැන කල්පනා කිරීමෙන් හානි සිදු වීමට ඉඩ තිබෙන නමුත්, වඩා දිගු කාල සීමාවක් ගැන කල්පනා කිරීමෙහි බොහෝ වාසි ඇත්තේ ය.

සමාජවාදී සංවර්ධනයේදී, අප තව මත් ක්‍රියා කරන්නේ බොහෝ දුරට අන්ධ ලෙස ය. අප හට සමාජවාදී ආර්ථිකය බොහෝ පැතිවලින් තව මත් නොදන්නා අවශ්‍යතාවයේ රජදහනකි. මා උදහරණයක් වශයෙන් ගන්න. ආර්ථික සංවර්ධනය පිළිබඳ වැඩේදී මට තව මත් නො තේරෙන බොහෝ ප්‍රශ්න තිබේ. නිදසුන් වශයෙන් කර්මාන්ත සහ වාණිජ්‍යය ගැන මා දන්නේ ඉතා ටිකකි. මම කෘෂිකර්මය ගැන කිසිවක් දනිමි, නමුත් මේ සාපේක්ෂක වශයෙන් කතා කරමින් පමණකි-මම තව මත් එතරම් නො දනිමි. කෘෂිකර්මය ගැන වැඩියෙන් දැනගැනීම පිණිස අයෙක් පස, උද්භිද විද්‍යාව, බෝග වගාව, කෘෂිරසායන විද්‍යාව, ගොවි යන්ත්‍රසූත්‍ර යනාදිය තේරුම් ගත යුතු ය. අයෙක් ධාන්‍ය, කපු, ආහාරයට ගන්නා තෙල්, හණ, පට, තේ, සීනි, එළවළු, දුම්කොළ, පලතුරු, බෙහෙත් පැල සහ විවිධ නිෂ්පාදිත වැනි කෘෂිකර්මයේ නොයෙක් ශාඛා ද තේරුම් ගත යුතු ය. පශු පාලනය සහ වනවගාව ද තිබේ. මම ද සෝවියට් පාංශු විද්‍යාඥ වී. ආර්. විලියම්ස්ගේ න්‍යායය අදහන්නෙක්මි. පස ගැන ඔහුගේ කෘතියෙහි විලියම්ස් ගොවිතැන, වනවගාවට සහ පශු පාලනය බද්ධ කිරීම වෙනුවෙන් කථා කළේ ය. අපට මේ ත්‍රිවිධ සම්බන්ධනය තිබිය යුතු ය, නැතහොත් කෘෂිකර්මයට හානි සිදු වේ ය'යි මම සිතමි. ඔබට වැඩවලින් කිසියම් විවේකයක් ලැබුණු විට කෘෂිකාර්මික නිෂ්පාදනය පිළිබඳ මේ ප්‍රශ්න ගැන බැරෑරුම් අධ්‍යයනයක් කරන ලෙස සහෝදරවරුන්ට අවවාද කිරීමට මම කැමැත්තෙමි. ඒවා තව ටිකක් අධ්‍යයනය කිරීමට මමත් කැමැති යි. කෙසේ වේවා, මේ දක්වා මේ කරුණු පිළිබඳ මගේ දැනුම ඉතා අල්ප වී ඇත. මා වඩාත් අවධානය යොමු කර තිබෙන්නේ නිෂ්පාදන සබඳතාවන්ට, ක්‍රමයට, සම්බන්ධ ප්‍රශ්න කෙරෙහි ය. නිෂ්පාදක බලවේගයන් පිළිබඳ ප්‍රශ්නයට ආ කල, මා දන්නේ ඉතා ස්වල්පයකි. මුළු එකක් වශයෙන් අපේ පක්ෂය සම්බන්ධයෙන්, සමාජවාදී සංවර්ධනය පිළිබඳ අපේ දැනුම ඉතා අප්‍රමාණවත් ය. ඉදිරියට එන වකවානුව තුළ අපි අත්දැකීම් රැස් කර ගත යුත්තෙමු, වෙහෙස වී අධ්‍යයනය කළ යුත්තෙමු, භාවිතාවේ යෙදෙන අතර අනුක්‍රමයෙන් අපේ අවබෝධය ගැඹුරු කරගනිමින්, සමාජවාදී සංවර්ධනයේ නියාමයන් ගැන වඩා පැහැදිලි වැටහීමක් ලබා ගත යුත්තෙමු. අපි අමාරු වැඩ හුඟක් කළ යුත්තෙමු, ඒ වැඩ මහත් ඕනෑකමින් පරීක්ෂා කිරීම හා අධ්‍යයනය කිරීම කළ යුත්තෙමු. අපි පහළ ම මට්ටම්වල තෝරාගත් තැන්වලට, නිෂ්පාදන බ්‍රිගේඩ හා නිෂ්පාදන කණ්ඩායම්වලට සහ, පැක්ටෙරි හා සාප්පුවලට යා යුත්තෙමු. අපි පරීක්ෂණය හා අධ්‍යයනය කිරීමේදී තරමක් හොඳින් වැඩ කිරීමට පුරුදු වී සිටියෙමු, නමුත් අගනගරවලට පිවිසි පසු එය බැරෑරුම් ලෙස නො කළෙමු. 1961 දී අපි එය යළිත් ඉදිරියට තල්ලු කළෙමු, දැන් තත්ත්වය තරමක් වෙනස් වී ඇත. එහෙත් ඇතැම් ස්ථානවල, කාර්යාංශවල සහ ව්‍යවසායවල නායක කාඩර්වරුන් අතර-විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ නායක කාඩර්වරුන් අතර-එය තව ම සාමාන්‍ය පුරුද්දක් බවට පත් වී නැත. ඇතැම් පළාත්බද පක්ෂ ලේකම් වරු තෝරාගත් තැන්වල නතර වීමට තවම ගොසින් නැත. පළාත්බද පක්ෂ ලේකම් වරු නො යත් නම්,

NMSG Library

ඔවුන් ප්‍රිපෙක්චර පක්ෂ ලේකම්වරුන්ට සහ කේරළ පක්ෂ ලේකම්වරුන්ට යන්නට කියන්නේ කෙසේ ද? මෙය නරක යි, වෙනස් කළ යුතු යි.

චීන මහජන සමූහාණ්ඩුව පිහිටුවා දෙළොස් අවුරුද්දක් ගත වී ඇත. මේ අවුරුදු දෙළහ, අට අවුරුදු මුල් වකවානුවකට සහ සිව් අවුරුදු දෙවැනි වකවානුවකට බෙදිය හැකි ය. නවසිය පණහේ සිට 1957 අවසානය තෙක් මුල් අට අවුරුද්ද වේ, 1958 සිට වර්තමානය තෙක් දෙවැනි සිව් අවුරුද්ද වේ. අපේ මේ සම්මන්ත්‍රණයේදී, අපේ අතීත වැඩවල, ප්‍රධාන වශයෙන් පසුගිය සිව් වසරේ වැඩවල, අත්දැකීම් සම්පිණ්ඩනය කිරීමට අප විසින් ප්‍රථම ප්‍රයත්නයක් දරා ඇත. මේ සම්පිණ්ඩනය සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළ වාර්තාවෙහි පිළිබිඹු වී තිබේ. අපි විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂ ප්‍රතිපත්ති දැනට ම සකස්කර ඇත්තෙමු, නැතහොත් සකස් කරගෙන යමු, නැතහොත් පසුව සකස් කරන්නෙමු. ගම්බද මහජන කොමියුන් ගැන වගන්ති 60, කර්මාන්ත ව්‍යවසාය ගැන වගන්ති 70, උසස් අධ්‍යාපනය ගැන වගන්ති 60 සහ විද්‍යාත්මක පර්යේෂණය ගැන වගන්ති 14 වැනි කෙටුම්පත් රෙකුලාසි දැනට ම සකස් කර තිබේ, ඒ සියල්ල දැනට ම වලංගු බවට පැමිණ ඇත, නැතහොත් අත්හදා බැලීමේ පදනම මත ක්‍රියාවේ යොදාගෙන යනු ලැබේ. අනාගතයේදී ඒවා, සමහරක් බාගවිට සංශෝධනය කරනු ලබනවා ඇත. දැනට ම සකස් කිරීමේ ක්‍රියාදාමයෙහි පවත්නා ඒවා අතර වාණිජ්‍ය වැඩ ගැන රෙකුලාසි වේ. අනාගතයේදී සකස් කරනු ලබන ඒවා අතර මධ්‍ය-පාසල් හා ප්‍රාථමික-පාසල් අධ්‍යාපනය ගැන රෙකුලාසි වේ. අපි අපේ පක්ෂ සහ ආණ්ඩු අවයවවලත් බහුජන සංවිධානවලත් වැඩ ගැන ද රෙකුලාසි වගයක් සකස් කළ යුත්තෙමු. හමුදාව දැනට ම රෙකුලාසි වගයක් සකස් කර ඇත. කොටින්, අපි කර්මාන්තය, කෘෂිකර්මය, වාණිජ්‍යය සහ සංස්කෘතිය හා අධ්‍යාපනය යන මේවායෙහි ද, හමුදාවෙහි, ආණ්ඩුවෙහි සහ පක්ෂයෙහි ද අපේ අත්දැකීම් සම්පිණ්ඩනය කිරීමේ වැඩය හොඳින් කළ යුත්තෙමු, මේ කොටස් හත තුළ අපේ වැඩ නිවැරදි මග ඔස්සේ ප්‍රගතිය කරා යන පරිදි මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගයක් සම්පාදනය කළ යුත්තෙමු.

සාමාන්‍ය ක්‍රියාමාර්ගයක් තිබීම ප්‍රමාණවත් නො වේ. ඊට අමතරව, එහි මගපෙන්වීම යටතේ අපට කර්මාන්තය, කෘෂිකර්මය, වාණිජ්‍යය, සංස්කෘතිය හා අධ්‍යාපනය, හමුදාව, ආණ්ඩුව සහ පක්ෂය යන මේවායෙහි අපේ තත්ත්වයට යෝග්‍ය වූ විශේෂ මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගයක් තිබිය යුතු ය. එවිට පමණකි බහුජනයාට සහ කාඩර්වරුන්ට අවබෝධයේ හා ක්‍රියාවේ ඒකත්වය ඇති කර ගැනීමට හැකි වන සේ ඔවුන් හට අධ්‍යාපනය දීම පිණිස මේවා ඉගැන්වීමේ කරුණු වශයෙන් පාවිච්චි කරමින් ඔවුන් තුළ විශ්වාසය ඇති කිරීමට අපට හැකි වන්නේ. එවිට පමණකි විප්ලවයේදී සහ සංවර්ධනයේදී ජය අත් කර ගැනීමට අපට හැකි වන්නේ. නො එසේ නම් බැරි ය. මේ කරුණ ගැන, ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධය පැවති කාලය තරම් ඉහතදී පවා අපට ගැඹුරු අවබෝධයක් තිබුණේ ය. ඒ කාලයේ අප ක්‍රියා කළේ මේ විධියට ය, ඒ නිසා කාඩර්වරුත් බහුජනයාත් ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ වකවානුව සඳහා වූ විශේෂ මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගය පිළිබඳ ඔවුන්ගේ අවබෝධයේදී ඒකත්වය අත් කර ගත්හ, එහෙයින් ක්‍රියාවේදී ඒකත්වය අත් කර ගත්හ; ඒ විප්ලවයේදී ජයග්‍රහනය කරා මග හෙළි කළේ එය යි. මෙය අප හැමෝ ම දන්නා දෙයකි. සමාජවාදී විප්ලවයත් සමාජවාදී සංවර්ධනයත් පිළිබඳ වකවානුවේ දී, මුල් අට අවුරුද්ද තුළ අපේ විප්ලවවාදී කාර්යභාරය වූයේ මේවා යඃ පිටිසර පෙදෙස්වල රදළ ඉඩම් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉක්බිති කෘෂිකර්මයේ සමූපකාර විපර්යාසකරණය මුදුන්පත් කිරීම; නගරවල, ධනවාදී කර්මාන්තයෙහි සහ වාණිජ්‍යයෙහි සමාජවාදී විපර්යාසකරණය මුදුන්පත් කිරීම. ආර්ථික සංවර්ධනයේදී, අපේ කාර්යභාර වූයේ ආර්ථිකය පුනරුත්ථාපනය කිරීම සහ පළමුවැනි පස්-අවුරුදු සැලැස්ම ක්‍රියාවේ යෙදීම ය. විප්ලවයත් සංවර්ධනයත් යන දෙකේදී ම අපට විෂයමූල තත්ත්වයන්ට යෝග්‍ය වූත් මුළුමනින් ම ලගන්නා සුලු වූත් සාමාන්‍ය ක්‍රියාමාර්ගයක් මෙන් ම සාමාන්‍ය ක්‍රියාමාර්ගයේ මගපෙන්වීම යටතේ මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගයක් ද තිබුණේ ය. එහෙයින් කාඩර්වරුන්ට සහ බහුජනයාට අධ්‍යාපනය දීමටත්, ඔවුන්ගේ අවබෝධය එක්සත් කිරීමටත් අපට හැකි විය, කාර්යභාරයෝ තරමක් හොඳින් ඉටු කරන ලදහ. මෙයත් හැමෝ ම දන්නා දෙයකි. එහෙත් ඒ දිනවල කරුණු පැවැති අන්දමට, ආර්ථික සංවර්ධනයෙහි ලා අපේ ම අත්දැකීම් අපට නො තිබුණු හෙයින් සෝවියට් සංගමය පිටපත් කිරීමට අපට සිදු විය. විශේෂයෙන් බර කර්මාන්තය පිළිබඳ ක්ෂේත්‍රයේදී, අපි අපේ පැත්තෙන් ඉතා ස්වල්ප නිර්මාණශීලීත්වයක් ඇතිව හැම දෙයක් ම මෙන් සෝවියට් සංගමයෙන් පිටපත් කළෙමු. ඒ කාලයේ එසේ කිරීම ඒකාන්තයෙන් ම අවශ්‍ය විය, එහෙත් එය දුර්වලකමක්-නිර්මාණශීලීත්වය නැතිකමක් සහ අපේ ම දෙපයින් නැගී සිටීමට ශක්තිය නැතිකමක් ද විය. සත්තකින් ම මෙය අපේ දිර්ඝ-කාලීන ප්‍රතිපත්තිය නො විය හැකි විය. 1958 සිට පටන් ගනිමින් අපි අනුබලයක් වශයෙන් විදේශ ආධාර සොයන අතර ප්‍රධාන වශයෙන් අපේ ම පරිශ්‍රමය මත හේත්තු වීම පිළිබඳ පැහැදිලි ලෙස සකස් කළ ප්‍රතිපත්තිය ස්ථාපිත කළෙමු. 1958 දී පක්ෂයේ අටවැනි ජාතික සම්මේලනයේ දෙවැනි සැසියේදී, අපි ''සමාජවාදය ගොඩනැගීමේදී මුළු වැර යොදා වැඩ කිරීම. උසස් අරමුණු ඇති කර ගැනීම සහ වඩා ලොකු, වඩා ඉක්මන්, වඩා හොඳ, වඩා සකසුරුවම් ප්‍රතිඵල අත් කර ගැනීම'' පිළිබඳ සාමාන්‍ය ක්‍රියාමාර්ගය සම්මත කළෙමු. ඒ අවුරුද්දේ ම මහජන කොමියුන් පිහිටවනු ලැබී ය, ''මහ ඉදිරි පිම්මක්'' පිළිබඳ සටන්පාඨය නගනු ලැබී ය. සමාජවාදී සංවර්ධනය සඳහා සාමාන්‍ය ක්‍රියාමාර්ගය ප්‍රකාශනය කළ පසු එක්තරා කාල සීමාවක් යන තුරු අපේ තත්ත්වයන්ට යෝග්‍ය විශේෂ මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගයක් සම්පාදනය කිරීමට අපට කාලය තිබුණේ නැත, අපේ අත්දැකීම් එතෙක් ම ප්‍රමාණවත් නුවූ නිසා එසේ කිරීමට පුළුවන්කම ද අපට තිබුණේත් නැත. මේ තත්ත්වයන් යටතේ, කාඩර්වරුන්ගේ සහ බහුජනයාගේ ප්‍රයෝජනය සඳහා ඉගැන්වීමේ කරුණු සම්පූර්ණ තොගයක් නො තිබුණෙන්, ප්‍රතිපත්තිය ගැන කිසි ක්‍රමානුකූල අධ්‍යාපනයක් ලබා ගන්නට ඔවුන්ට බැරි

විය, එහෙයින් අවබෝධයෙහි සහ ක්‍රියාවෙහි අව්‍යාජ ඒකත්වයක් ඇති කර ගත හැකි ය'යි නො සිතිය හැකි විය, මේ පුළුවන්කම ඇති වූයේ කාල සීමාවකට පසු ව, අප බාධාවන් වගයකට භාජනය වී, සක්‍රිය වූ ත් නිෂ්ක්‍රිය වූ ත් අත්දැකීම් අත් කර ගත් පසු ව, පමණි. දැන් කරුණු වඩා යහපත් ය. අපට මේ දේ තිබේ, නැතහොත් අපි ඒවා සම්පාදනය කරගෙන යමින් සිටිමු. එසේ සමාජවාදී විප්ලවයත් සමාජවාදී සංවර්ධනයත් වඩා හොඳින් කරගෙන යාමට අපට හැකි ය. සාමාන්‍ය ක්‍රියාමාර්ගයේ මගපෙන්වීම යටතේ විශේෂ මූලධර්ම, ප්‍රතිපත්ති සහ පියවර සම්පූර්ණ තොගයක් සම්පාදනය කරනු පිණිස, අපි බහුජනයාගෙන් අදහස් ලබා ගැනීමේ සහ ක්‍රමානුකූල, අනූන පරීක්ෂණයක් හා අධ්‍යයනයක් කිරීමේ ක්‍රම යෙදිය යුත්තෙමු. අපි ඉතිහාසීය වශයෙන් අපේ වැඩවල සාර්ථක සහ අසාර්ථක අත්දැකීම් විභාග කර බැලිය යුත්තෙමු. එසේ පමණකි විෂයමූල දේවල ආවේණික වූත්, මිනිසුන්ගේ කල්පනා ශක්තියෙන් මනෝමූල ලෙස ප්‍රබන්ධ නො කළාවූත් නියාමයන් අනාවරණය කිරීමට අපට හැකි වන්නේ; එසේ පමණකි අපේ තත්ත්වයන්ට යෝග්‍ය වූ රෙකුලාසි සකස් කිරීමට අපට හැකි වන්නේ, මෙය ඉතා වැදගත් කරුණකි, කරුණාකර ඊට අවධානය යොමු කරන ලෙස මම මෙහි සිටින සහෝදරවරුන්ගෙන් ඉල්ලමි.

කර්මාන්තය, කෘෂිකර්මය, වාණිජ්‍යය, සංස්කෘතිය හා අධ්‍යාපනය, හමුදාව, ආණ්ඩුව සහ පක්ෂය යන - කොටස් හතෙහි අංගසම්පූර්ණ නායකත්වය ක්‍රියාවේ යොදන්නේ පක්ෂය යි. පක්ෂය කර්මාන්තයට, කෘෂිකර්මයට, වාණිජ්‍යයට, සංස්කෘතියට හා අධ්‍යාපනයට, හමුදාවට සහ ආණ්ඩුවට නායකත්වය දිය යුතු ය. සාමාන්‍යයෙන් කියන කළ, අපේ පක්ෂය හොඳ ය. අපේ පක්ෂය තැනී ඇත්තේ ප්‍රධාන වශයෙන් කම්කරුවන්ගෙන් සහ දිළිඳු ගොවියන්ගෙන් ය. අපේ කාඩර්වරුන් අතුරෙන් විශාල වැඩිපිරිස හොඳ ය, ඔවුහු සියලු දෙනා ම වෙහෙස වී වැඩ කරති. එහෙත් ප්‍රශ්න වගයක් තව ම තිබෙන බව ද අපි වටහා ගත යුත්තෙමු, අපේ පක්ෂයේ හැම දෙය ක් ම හරි ම කදිම ය'යි අපි කල්පනා නො කළ යුත්තෙමු. දැනට අපට පක්ෂ සාමාජිකයෝ 1,70,00,000 කට වඩා සිටිති, ඔවුන් අතුරෙන් සියයට 80 කට වඩා පක්ෂයට බැඳුණේ මහජන සමූහාණ්ඩුව පිහිට වූ පසු ය, එනම්, නවසිය පණස් ගණන්වල ය. අපේ මහජන සමූහාණ්ඩුව පිහිටුවීමට පෙර පක්ෂයට බැඳුණු අය තනන්නේ සියයට 20 ක් පමණකි. මේ සියයට 20 න්, අවුරුදු කිපයකට පෙර, කළ ගණන් බැලීමක් අනුව, 1930 ට පෙර, එනම්, නවසිය විසිගණන්වලදී, බැඳුණු අයගේ මුළු ගණන මිනිසුන් 800 ක් පමණ ය. පසුගිය අවුරුදු දෙක තුන තුළ සමහරු මිය ගොස් ඇත. එහෙයින් බාගවිට ඉතිරි වී සිටින්නේ 700 ගණනක් පමණවත් විය හැකි ය. පරණ පක්ෂ සාමාජිකයන් අතරත්, අළුත් පක්ෂ සාමාජිකයන් අතරත් - විශේෂයෙන් අළුත් සාමාජිකයන් අතර - චරිතයෙන් හෝ වැඩ ශෛලියෙන් අපවිත්‍ර සමහරු සිටිති. ඔවුහු පුද්ගලිකවාදියෝ, නිළධරවාදියෝ, මනෝමූලවාදියෝ, නැතහොත් පිරිහුණු කොටස් පවා වෙති. නමින් පමණක් කොමියුනිස්ට් පාක්ෂිකයන් වන නමුත් කම්කරු පංක්තිය නියෝජනය නො කරන සමහර අය ද සිටිති, එසේ නො කරනවා පමණක් නො ව, ඔවුහු ධනේශ්වර පංක්තිය නියෝජනය කරති. පක්ෂය තුළ සියල්ල පවිත්‍ර නො වේ. අපි මේ සත්‍ය කාරණය දැනගෙන සිටිය යුත්තෙමු, නැතහොත් අපට කරදර විඳින්නට සිදු වෙනවා ඇත.

මගේ සිව්වැනි කරුණ මෙය යි. කොටින්, අප විසින් විෂයමූල ලෝකය තේරුම් ගැනීමට ක්‍රියාදාමයක් අවශ්‍යයෙන් ම පටලැවෙන්නේ ය. පටන්ගැන්මේදී අපට නො තේරේ, නැතහොත් සම්පූර්ණයෙන් නො තේරේ; සම්පූර්ණ හෝ සාපේක්ෂක වශයෙන් සම්පූර්ණ අවබෝධය අනුක්‍රමයෙන් වර්ධනය කළ හැකි වන්නේ මුදුන්පත් කිරීම් සහ ජයග්‍රහණයන් කරා, ඇදවැටීම් හා පරාජයන් කරා පමුණුවන්නාවූ භාවිතාවෙහි යළි යළිත් යෙදීම තුළින් සහ, සාර්ථකභාවයන් සහ අසාර්ථකභාවයන් සංසන්දනය කිරීම තුළින් පමණකි. එතැනට එළඹුණු කල, අපට මුලපිරුමේ ශක්තිය වැඩියෙන් තිබෙනවා ඇත, අප වඩා ලොකු නිදහසක් බුක්ති විඳිනවා ඇත, දැනට වඩා තරමක් ඥානවන්ත වෙනවා ඇත. නිදහස යනු අවශ්‍යතාව හඳුනාගැනීම සහ විෂයමූල ලෝකය විපර්යාස කිරීම යි. අවශ්‍යතාව හඳුනාගැනීමේ පදනම මත පමණකි මිනිසුන්ට ක්‍රියාවේ නිදහස තිබිය හැකි වන්නේ. මෙය නිදහසේ සහ අවශ්‍යතාවේ අපෝහවාදය යි. අවශ්‍යතාව එපරිද්දෙන් ම විෂයමූල වශයෙන් පවත්නා නියාමයක් වේ. අප එය හඳුනාගැනීමට පෙර අපේ ක්‍රියාව කිසි කලෙක සවිඥනක විය නො හැකි ය, එය අන්ධභාවයට සහභාගි වේ. මේ තත්ත්වයන් යටතේ අපි මෝඩ මිනිස්සු වෙමු. පසුගිය අවුරුදු කීපය තුළ අප මෝඩ වැඩ රැසක් කර නැද්ද?

**පස්වැනි කරුණ: ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරය. මේ ප්‍රශ්නය ගැන මා කියන්නට යන්නේ වචන කීපයක් පමණි.**

චීනයෙහි වේවා, ලෝකයේ අන් රටවල්වල වේවා, හැම දෙයක් ම සලකා බැලූ පසු, ජනගහනයෙන් සියයට 90 ක් අන්තිමේදී මාක්ස්-ලෙනින්වාදයට අනුබල දෙනවා ඇත. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්, සංශෝධනවාදීන්, අධිරාජ්‍යවාදීන් සහ ප්‍රතිගාමීන් විසින් කැරෙන මුළාකිරීම් නිසා අවදි වී නැති බොහෝ මිනිස්සු ලෝකයේ තව ම සිටිති. එහෙත් කවද හරි ඔවුන් අනුක්‍රමයෙන් අවදි වී, මාක්ස්-ලෙනින්වාදයට අනුබල දෙනවා ඇත. මාක්ස්-ලෙනින්වාදය නමැති සත්‍යය නො වැළැක්විය හැකි ය. කවද හරි බහුජන සමූහයෝ විප්ලවයෙන් නැඟී සිටිනවා ඇත. කවද හරි ලෝක විප්ලවය ජය ගන්නවා ඇත. කවද හරි, ලූ ශුන්ගේ පොතෙහි එන චරිත - චාඕ නිලමේ, චියන් නිලමේ සහ ආ කිව් විප්ලවයෙන් වළකන බොරු විදේශීය යකා - වැනි අන්‍යයන්ට විප්ලවය කිරීම තහනම් කරන අය පරාජය කරනු ලබනවා ඇත.

සෝවියට් සංගමය පළමුවැනි සමාජවාදී රාජ්‍යය විය, සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය ඇති කරන ලද්දේ ලෙනින් විසින් ය. සෝවියට් පක්ෂයේත් රාජ්‍යයේත් නායකත්වය දැන් සංශෝධනවාදීන් විසින් පැහැරගෙන තිබෙන නමුත්, සෝවියට් ජනතාව අතරත්, සෝවියට් පක්ෂ සාමාජිකයන් හා කාඩර්වරුන් අතරත් සමූහයෝ හොඳ ය, ඔවුහු විප්ලවයට කැමැති ය, සංශෝධනවාදී පාලනය වැඩි කලක් නො පවතින්නේ ය යන විශ්වාසයෙහි තරව පිහිටා සිටින ලෙස සහෝදරවරුන්ට අවවාද කිරීමට මම කැමැත්තෙමි. කාලය කුමක් වුවත් - දැන් හෝ අනාගතයේදී, අපේ පරම්පරාවේදී හෝ මත්තට එන පරම්පරාවන්හිදී - අපි සෝවියට් සංගමයෙන් ඉගෙනගත යුත්තෙමු. එහි අත්දැකීම් අධ්‍යයනය කළ යුත්තෙමු. අප සෝවියට් සංගමයෙන් නො ඉගෙනගන්නවා නම්, අප අතින් වැරදි සිදු වෙනවා ඇත. සෝවියට් සංගමය තිබෙන්නේ සංශෝධනවාදීන්ගේ පාලනය යටතේ නිසා අප තව මත් එයින් උගත යුතු ද'යි මිනිසුන් ඇසීමට ඉඩ තිබේ. අප අධ්‍යයනය කළ යුත්තේ සෝවියට් සංගමයේ හොඳ මිනිසුන් සහ හොඳ දේ ය, සෝවියට් පක්ෂයේ හොඳ අත්දැකීම් ය, සෝවියට් කම්කරුවන්ගේ හා ගොවියන්ගේත්, වැඩ කරන ජනයා සමග කිට්ටු බැඳී ඇති බුද්ධිමතුන්ගේත් හොඳ අත්දැකීම් ය. සෝවියට් සංගමයේ නරක මිනිසුන් සහ නරක දේ ද, සෝවියට් සංශෝධනවාදීන් ද සම්බන්ධයෙන්, අපි ඔවුන්ට නිෂ්ක්‍රීය ආදර්ශයෙන් උගන්වන ගුරුවරුන්ට මෙන් සංග්‍රහ කළ යුතු ය, ඔවුන්ගෙන් පාඩම් උද්ග්‍රහණය කළ යුතු ය.

අපි හැම විට ම නිර්ධනපංක්ති ජාත්‍යන්තරවාදී එක්සත්කම පිළිබඳ මූලධර්මය නඟාතිබිය යුත්තෙමු. සමාජවාදී රටවල් සහ ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරය මාක්ස්-ලෙනින්වාදයේ පදනම මත ස්ථිර ලෙස එක්සත් විය යුතු ය'යි අපි හැම විට ම කියා සිටිමු. ලෝකයේ සංශෝධනවාදීන් අපට ගැරහීම කිසි කලෙක නතර කරන්නේ නැත. අපේ ආකල්පය, ඔවුන් කැමති හැටියක් කිරීමට ඔවුන්ට ඉඩ දීම යි. අපි අවශ්‍ය වූ විට යුතු ලෙස පිළිතුරු දෙමු. අපේ පක්ෂය ගරහනු ලැබීමට පුරුදු වී ඇත. අතීතයේදී අපට පහර දුන් අය පසෙකට කළත්, වර්තමානය ගැන කෙසේ ද? පිටරට, අධිරාජ්‍යවාදියෝ අපට ගරහති, ප්‍රතිගාමී ජාතිවාදියෝ අපට ගරහති, විවිධ රටවල්වල ප්‍රතිගාමියෝ අපට ගරහති, සංශෝධනවාදියෝ අපට ගරහති; සියරටෙහි, චියාං කායි ශෙක් අපට ගරහයි. ඉඩම්හිමියන්, පොහොසත් ගොවියන්, ප්‍රතිවිප්ලවවාදීන්, නරක කොටස් සහ දක්ෂිණවාදියෝත් ඒ වාගේ ම ය. බොහෝ කලක් ම තත්ත්වය මෙය ම වී ඇත, අපි දැනට ම ඊට පුරුදු වී සිටිමු. එහෙත් අපි තනි වී සිටිමු ද? මට නම් තනි වූ බවක් නො හැඟේ. මිනිස්සු 7000 කට වඩා මෙහි සිටිති. මිනිසුන් 7000 කට වැඩි ගණනක් තනි වන්නේ කෙසේ ද? (සිනාව) අපේ රටේ මිනිස්සු 60 කෝටියකට වඩා සිටිති. අපේ මිනිස්සු එක්සත් ය. මිනිසුන් 60 කෝටියකට වැඩි ගණනක් තනි වන්නේ කෙසේ ද? සියලු රටවල්වල බහුජන සමූහයෝ අප සමග එකතු වී, දැනට ම නැඟී සිටිති. නැතහොත් නැඟී සිටීමට යති. අප තනි කිරීම කළ හැකි ද?

**හයවැනි සහ අන්තිම කරුණ: අපි මුළු පක්ෂයත් මුළු ජනතාවත් එක්සත් කළ යුත්තෙමු.**

අපි පක්ෂය තුළත් ඉන් පිටතත් දියුණු කොටස් සහ ක්‍රියාකාරකයන් එක්සත් කළ යුත්තෙමු, පස්සෙන් ගාටන අය ඉදිරියට ගෙන ඒම පිණිස මැද කොටස් එක්සත් කළ යුත්තෙමු. මේ අයුරින්, මුළු පක්ෂයත් මුළු ජනතාවත් එක්සත් කිරීමට අපට හැකි ය. එබඳු එක්සත්කමක් මත හේත්තු වීමෙන් පමණකි අපේ වැඩ හොඳින් කිරීමට, දුෂ්කරතා මැඩපැවැත්වීමට සහ චීනය ගොඩනැඟීමට අපට හැකි වන්නේ. මුළු පක්ෂයත් මුළු ජනතාවත් එක්සත් කිරීම යන්නෙන් අදහස් වන්නේ අපට අපේ ම තත්ත්වයක් නැති බව නො වේ. කොමියුනිස්ට් පක්ෂය ''මුළු ජනතාවගේ පක්ෂය'' වේ ය'යි සමහර මිනිස්සු කියති, එහෙත් අපි මේ විධියට කරුණු දෙස නො බලමු. අපේ පක්ෂය නිර්ධනපංක්තියේ දේශපාලන පක්ෂය, ඒ පංක්තියේ පෙරමුණු බලඇණිය, මාක්ස්-ලෙනින්වාදයෙන් සන්නද්ධ වූ සටන් කරන බලවේගයක්, වේ. අප සිටින්නේ මුළු ජනගහනයෙන් සියයට 95 කට වඩා අඩංගු කරගන්නාවූ බහුජනයාගේ පැත්තේ ය. කිසි ම අවස්ථාවක අපි ජනගහනයෙන් සියයට 4 ක් 5 ක් තනන ඉඩම්හිමියන්ගේ, පොහොසත් ගොවියන්ගේ, ප්‍රති-විප්ලවවාදීන්ගේ, නරක කොටස්වල සහ දක්ෂිණවාදීන්ගේ පැත්තේ නො සිටිමු. ජාත්‍යන්තර පරිමණ්ඩලයේ තුළත් එය එසේ ම සැබෑ ය: අපි සියලු මාක්ස් - ලෙනින්වාදීන් සමග, සියලු විප්ලවවාදී ජනයා සමග, සාමාන්‍යයෙන් ජනතාව සමග සමගිය වෙනුවෙන් කතා කරමු. කිසි ම අවස්ථාවෙක අපට කොමියුනිස්ට් - විරෝධී සහ ජනතා - විරෝධී අධිරාජ්‍යවාදීන් සහ ප්‍රතිගාමීන් සමග සමගිය වුවමනා නැත. හැකි හැම විට ම අපි කරුණු පහක පදනම මත ඔවුන් සමග ද රාජ්‍ය දූතසේවා සබඳකම් පිහිටුවා ගනිමු. ඔවුන් සමග සාමකාමී යහපැවැත්ම සඳහා වැර දරමු. එහෙත් මෙය සියලු රටවල්වල ජනතාව සමග අපේ සමගියට වෙනස් වූ ගණයකට ඇතුළත් ය. සමගිය පක්ෂයත් ජාතියත් පුරා පැතිර පැවතීමට නම්, අපි ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් ක්‍රියාකාරී වීමට ඉඩ දිය යුත්තෙමු, මිනිසුන්ට කට ඇර කතා කිරීමට ඉඩ දිය යුත්තෙමු. මෙය පක්ෂය තුළත් ඉන් පිටතත් වලංගු ය. පළාත්බද, ප්‍රිපෙක්චර සහ කෝරළ පක්ෂ කොමිටිවලින් පැමිණ සිටින සහෝදරවරුනි, ඔබ ආපසු ගිය විට, ඔබ මිනිසුන්ට කට ඇර කතා කිරීමට ඉඩ දිය යුතු ය. නොපැමිණි හෝ පැමිණි සියලු සහෝදරවරු මේ විධියට ක්‍රියා කළ යුතු ය. පක්ෂයේ සියලු නායක සහෝදරවරු පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කළ යුතු ය, මිනිසුන්ට කට ඇර කතා කිරීමට ඉඩ දිය යුතු ය. සීමාවල් මොනවා ද? එකක්, අඩු පිරිස වැඩි පිරිසට ද, මුළු සාමාජික පිරිස මධ්‍යම කාරකසභාවට ද අවනත වෙමින්, පක්ෂ විනය පිළිපැදිය යුතු බව ය.

කිසි ම රහස් කට්ටියක් සංවිධානය නො කළ යුතු බව තවත් සීමාවකි. අපි එළිපිට සිටින විරුද්ධකාරයන්ට බිය නො වමු, අප බිය වන්නේ රහසින් සිටින විරුද්ධකාරයින්ට පමණකි. එබඳු අය ඔබගේ මූණ ඉදිරියේ ඇත්ත කතා නො කරති, ඔවුන් කියන්නේ බොරු සහ රැවටිලි බස් පමණකි. ඔවුහු ඔවුන්ගේ නියම අභිප්‍රාය ප්‍රකාශ නො කරති. යම්කිසි

පුද්ගලයෙක් යම්තාක් කල් විනය කඩ නො කරන්නේ ද, රහස් කට්ටිවාදී වැඩකටයුතුවල නො යෙදෙන්නේ ද, එතාක් කල් අපි ඔහුට කට ඇර කතා කිරීමට ඉඩ දිය යුත්තේම, ඔහු වැරදි දේ කිව හොත් ඔහුට දඬුවම් නො කළ යුත්තෙමු. මිනිසුන් වැරදි දේ කියතොත්, ඔවුන් විවේචනය කළ හැකි ය, එහෙත් අපි කරුණු සහිතව ඔවුන්ට ඒත්තු ගැන්විය යුත්තෙමු. ඔවුන් ඒ වුණත් ඒත්තු නො ගනිත් නම් කෙසේ ද? ඔවුන්ගේ මත එසේ ම තබා ගැනීමට ඔවුන්ට ඉඩ දිය හැකි ය. අඩු පිරිස වැඩි පිරිස විසින් සම්මත කළ යෝජනාවන්ට හා තීරණයන්ට නියැලී සිටින තුරු, ඔවුන්ගේ මත එසේ ම තබා ගන්නට අඩු පිරිසට හැකි ය. පක්ෂය තුළත් ඉන් පිටතත් අඩු පිරිසට එසේ කිරීමට ඉඩ දීම වාසියට සිටී. ඔවුන්ගේ වැරදි මත තාවකාලික වශයෙන් එසේ ම තබා ගැනීමට ඔවුන්ට ඉඩ දුන හොත්, අනාගතයේදී ඒවා නිවැරදි කර ගන්නට ඔවුන්ට හැකි ය. බොහෝ විට අඩු පිරිසේ අදහස් නිවැරදි බව පෙනී යයි. එබඳු අවස්ථා ඉතිහාසයෙහි සුලබ ය. පටන් ගැන්මේ දී, සත්‍යය තිබෙන්නේ මිනිසුන් වැඩි පිරිස අතේ නො වේ, අඩු පිරිස අතේ ය. මාක්ස් සහ එංගල්ස් සත්‍යය ඔවුන්ගේ අත්වල ඇති ව සිටියහ, එහෙත් ආරම්භයේදී ඔවුන් සිටියේ අඩු පිරිසෙහි ය. බොහෝ කලක් ම ලෙනින් ද අඩු පිරිසෙහි සිටියේ ය. අපට ද අපේ පක්ෂයෙහිත් එබඳු අත්දැකීම් තිබුණේ ය. අපේ පක්ෂය චෙන් තු-ශියු විසින් පාලනය කරනු ලැබූ කාලයෙහි සහ ''වාම'' අවස්ථාවාදී ක්‍රියාමාර්ගය ඉස්මතු වී පැවති කාලයෙහි, සත්‍යය තිබුණේ නායක අවයව තුළ සිටි වැඩි පිරිස අතේ නො වේ, අඩු පිරිස අතේ ය. ඉතිහාසීය වශයෙන්, කොපර්නිකස්, ගැලීලියෝ සහ ඩාවින් වැනි ස්වභාව විද්‍යාඥයන්ගේ ධර්මයෝ ඉතා දිගු කලක් යන තුරු මිනිසුන් අතර වැඩි පිරිස විසින් නො පිළිගන්නා ලදහ, එසේ නො පිළිගත්තා පමණක් නො ව වැරදි ය' යි සලකන ලදහ. ඔවුන්ගේ කාලයේදී ඔවුන් සිටියේ අඩු පිරිසෙහි ය. 1921 දී අපේ පක්ෂය ආරම්භ කළ අවස්ථාවේ, අපට සිටියේ සාමාජිකයන් දුසිම් ගණනක් පමණකි; අපත් සිටියේ අඩු පිරිසෙහි ය, එහෙත් ඒ මිනිස්සු දුසිම් කීපය සත්‍යය නියෝජනය කළහ, චීනයේ ඉරණම නියෝජනය කළහ.

හිරභාරයට ගැනීම සහ නීතියට අනුව මරණයට පත් කිරීම් පිළිබඳ ප්‍රශ්නය ද තිබේ; එගැනත් කිසිවක් කීමට මට වුවමනා ය. දැනට විප්ලවයේදී ජය ලබා හුදෙක් අවුරුදු දෙළහක් තරම ගත වූ පසු, පෙරළා දමනලද ප්‍රතිගාමී පංක්තිවලට අයත් කොටස් යම්තාක් කල් ප්‍රතිසංස්කරණය නො කරනු ලැබ සිටිත් ද ඒතාක් කල් ද, ඊටත් වඩා, ඔවුන් අතුරෙන් සමහරු යම්තාක් කල් ප්‍රතිස්ථාපනය පිණිස තව ම කුමන්ත්‍රණය කරමින් සිටිත් ද ඒතාක් කල්, කීප දෙනෙක් හිරභාරයට ගෙන නීතිය අනුව මරණයට පත් කළ යුතු ය; නො එසේ නම් ජනතාවගේ කෝපය සංසිඳවිය නො හැකි ය, ජනතාවගේ ආඥදායකත්වය තහවුරු කළ නො හැකි ය. එහෙත් අපි සැහැල්ලු ලෙස මිනිසුන් හිරභාරයට නො ගත යුත්තෙමු, අපි විශේෂයෙන් ම සැහැල්ලු ලෙස මරණයට නො පත් කළ යුත්තෙමු. අපේ ශ්‍රේණින් තුළට හොරෙන් රිංගාගෙන සිටින සමහර නරක මිනිස්සු, සමහර නරක කොටස් සහ පිරිහුණු කොටස්, දුෂ්ට ලෙස සහ අදමිත ලෙස හැසිරෙමින්, ජනතාවගේ පිට උඩ නැඟී ගමන් කරති, ඔවුන් මත මළ මූ පහරති, නීති හා විනය බරපතල ලෙස කඩ කරති. ඔවුහු පුංචි චියාං කායි-ශෙක්ලා ය. මේ වර්ගයේ මිනිසුන් ගැන ක්‍රියා කරන විධියක් අපට තිබිය යුතු ය: ඔවුන් අතර සිටින දරුණු අපරාධ කර ඇති ඉතා ම නරක අය හිරභාරයට ගත යුතු ව සහ සමහරුන් නීතිය අනුව මරණයට පත් කළ යුතුව ඇත. කවර හෙයින් ද යත් අපි ඔවුන් කිසිවකු හිරභාරයට ගැනීම හෝ නීතියට අනුව මරණයට පත් කිරීම නො කරමු නම්, ජනතාවගේ කෝපය සංසිඳවන්නට අපට පුළුවන් වන්නේ නැති නිසා ය. ''හිරබාරයට ගැනීම් වළක්වන්නට අපට බැරි ය, නීතියට අනුව මරණයට පත් කිරීම් වළක්වන්නට අපට බැරි ය,'' යි අප කියන කල අප අදහස් කරන්නේ මෙය යි. එහෙත් අපි ඒකාන්තයෙන් ම පමණට වඩා හිරබාරයට ගැනීම හෝ පමණට වඩා මරණයට පත් කිරීම නො කළ යුත්තෙමු. මනාපය පරිදි හිරබාරයට ගත හැකි හෝ මනාපය පරිදි මරණයට පත් කළ හැකි අය සම්බන්ධයෙන්, අපි නියත වශයෙන් ම ඔවුන් හිරබාරයට ගැනීම වත් මරණයට පත් කිරීම වත් නො කළ යුත්තෙමු. එක් කලෙක ෂැංහයි නුවර උප-පුරපති වශයෙන් සේවය කළ, පාන් හාන්-නියන් නමැති හාදයෙක් සිටියේ ය. ඊට කලින් ඔහු රහසින් කුඕමින්තාං පක්ෂයට යටතේ වූ සී. සී. කල්ලියේ සාමාජිකයෙකු වී සිටියේ ය. ඔහු දැන් සිටින්නේ හිරේ ය, අප ඔහු මරණයට පත් කළේ නැත. අප පාන් හාන්-නියන් වැනි එක් හාදයෙකු මැරුව හොත්, එමගින් මරණයට පත් කිරීම මත පණවා තිබෙන සීමාවන් ලිහිල් කළ හොත්, එවිට ඔහු වැනි සියලු ම දෙනා මරණයට පත් කළ යුතු වෙනවා ඇත. කුඕමින්තාං රහස් ඒජන්ත කෙනෙකු වූ වොං ශි-වෙයි නමැති තවත් හාදයෙක් සිටියේ ය. යෙන්ආන්හි සිටි කාලයේ, ඔහු ''වන ලිලී මල'' යන හිසින් යුත් ලිපියක් ලීවේ ය; එහි ඔහු විප්ලවයට පහර දුන්නේ ය, කොමියුනිස්ට් පක්ෂයට අවඥ කළේ ය. පසුව ඔහු හිරබාරයට ගෙන මරනු ලැබී ය. මරණයට පත් කිරීම කරන ලද්දේ ආරක්ෂක අවයව ගමනේ යෙදී සිටියදී ඒවා විසින් ම ය; තීරණය කරන ලද්දේ මධ්‍යම කාරකසභාව විසින් නො වේ. අප මේ සිද්ධිය ගැන බොහෝ විට විවේචන කර තිබේ, අපේ මතය ඔහු නො මැරිය යුතු ව තිබුණු බව ය. ඇත්ත ඔහු රහස් ඒජන්ත කෙනෙකි, ඔහු අපට පහර දීමට ලිපි ලීවේ ය, ඔහු ඔහුගේ පිළිවෙල හරිගස්සා ගැනීම නිකම් ම ප්‍රතික්ෂේප කළේ ය. ඒ වුණත් ඔහු ගැන අනුකම්පා සහගත ව ක්‍රියා කරමින්, ඔහුට ශ්‍රමයෙහි යෙදෙන්නට ඉඩ දීමට අපට පුළුවන්කම තිබුණේ ය. ඔහු මැරීම හොඳ දෙයක් නො වී ය. අප හිරබාරයට ගත යුත්තේත් මරණයට පත් කළ යුත්තේත් මිනිසුන් හැකි තරම් ටික දෙනෙකි. අප හිතෙන හිතෙන හැටියට මිනිසුන් හිරබාරයට ගැනීමට සහ මරණයට පත් කිරීමට ගියොත්, හැම දෙනා ම තමතමා ගැන බිය වෙනවා ඇත, කිසිවෙක් කතා කිරීමට එඩිතර නො වෙනවා ඇත. එබඳු වාතාවරණයක් තුළ එතරම් ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්නට බැරි ය.

අපි වගවිභාගයක් නැතිව මිනිසුන්ට තොප්පි දැමීමත් නො කළ යුතු යි. සමහර සහෝදරවරු මිනිසුන් මත පීඩනය ඇති කරනු පිණිස තොප්පි පාවිච්චි කිරීමට ඇබ්බැහි වී සිටිති. ඔවුන් කතා කිරීමට පටන් ගන්නා ඇසිල්ලේ ම තොප්පි වටේ පියාඹන්නට පටන් ගනී, මිනිස්සු කොතරම් බියට පත් වෙත් ද යත් ඔවුහු කතා කිරීමට එඩිතර නො වෙත්. සත්තකින්

ම තොප්පි නම් සැම විට ම තිබෙනවා ඇත; සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළ වාර්තාවෙහි බොහෝ තොප්පි නැද්ද? ''විමධ්‍යගතවාදය'' තොප්පියක් නො වේ ද? එහෙත් අපි මෙයා විමධ්‍යගතවාදියෙකි, අරයා විමධ්‍යගතවාදියෙකි'යි කියමින්, අන්තිමේදී සියලු දෙනා ම විමධ්‍යගතවාදී වන තුරු, හිතෙන හිතෙන හැටියට මිනිසුන්ට තොප්පි නො දැමිය යුත්තෙමු. අදාළ උදවිය, අනික් අය විසින් තමන්ට තොප්පි දමනවාට වඩා, තමන් ම තොප්පි දමා ගැනීම - එමතු නොව හරි තොප්පි දමා ගැනීම - වඩා හොඳ විය හැකි ය. මිනිසුන් තමන් ම තොප්පි දමාගෙන, ටික කලක් ඒවා පැළඳගෙන සිටිතොත්, ඒවා තව දුරටත් නො ගැලපේ ය'යි හැමෝ ම එකඟ වූ විට ඒවා ඉවත් කළ යුතු ය. මෙය යහපත් ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් නිර්මාණය කරනවා ඇත. මිනිසුන් බියෙන් තොරව සිටින සේත්, කතා කිරීමට එඩිතර වන සේත්, අපි අන්‍යයන්ගේ වැරදි අල්ලා නො ගැනීම, මිනිසුන්ට තොප්පි නො දැමීම සහ තඩි පොල්ල නො වැනීම අනුමත කරමින් කතා කරමු.

වැරදි කර සිටින අයටත්, මිනිසුන්ට කට ඇර කතා කිරීමට නො දෙන අයටත් හොඳ හිත සහ උපකාරවත් ආකල්පයක් පෙන්විය යුතු ය. තමන් විසින් කිසි වරදක් කිරීමට පුළුවන්කමක් නැත, එසේත් නැතහොත් වරක් තමන් අතින් වරදක් සිදු වුව හොත් ප්‍රතිවිපාක භයානක වෙනවා ඇත, යළිත් කිසි කලෙක තමන්ට හිස ඔසවන්නට පුළුවන් වන්නේ නැත ආදී වශයෙන් මිනිසුන්ට හැඟන විධියේ වාතාවරණයක් අප විසින් ඇති නො කළ යුතු ය. වැරදි කර සිටින තැනැත්තෙක් යම්තාක් කල් තමාගේ පිළිවෙල හරිගස්සා ගැනීමට ඇත්ත වශයෙන් බලාපොරොත්තු වන්නේ ද, අව්‍යාජ ස්වයං-විවේචනයක් කර ඇත්තේ ද, ඒතාක් කල් අපි ඔහු සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කළ යුත්තෙමු. යම්කිසි තැනැත්තෙක් පළමු වරට හෝ දෙවැනි වරට ස්වයං-විවේචනයක් කරන කල, අපි ඔහුගෙන් පමණට වඩා ඉහළ ඉල්ලීම් නො කළ යුත්තෙමු. ඔහු ගේ ස්වයං-විවේචනය තව ම අනූන නො වුණාට කමක් නැත. අපි ඔහුට නැවත සිතා බැලීමට ඉඩ දිය යුත්තෙමු, ඔහුට හොඳ අදහසින් උදව් දිය යුත්තෙමු. මිනිසකුට අන්‍යයන්ගෙන් ආධාර වුවමනා කරයි. අපි වැරදි කරන සහෝදරයෙකුට ඔහුගේ වැරදි අවංක ලෙස ස්වයං-විවේචනය කරත් නම්, වැරදි නිවැරදි කර ගැනීමට කැමති වෙත් නම්, අපි ඔවුන්ට සමාව දිය යුත්තෙමු. ඔවුන් කෙරෙහි ලිහිල් ප්‍රතිපත්තියක් යෙදිය යුත්තෙමු. යම්තාක් කල් ඔවුන් මුදුන්පත් කරන දේ මූලික වන්නේ ද, ඔවුහු සෑහෙන තරමට කාර්යක්ෂම වන්නෝ ද, ඒතාක් කල් දිගට ම ඔවුන්ගේ පදවිවල සිටීමට ඔවුන්ට ඉඩ දෙන්න.

මගේ කථාවේදී මා යම්යම් ප්‍රපංච විවේචනය කර ඇත, යම්යම් සහෝදරවරුන් විවේචනය කර ඇත, එහෙත් මා ඔවුන් නම් කර නැත, එයා හෝ මෙයා ඇත්ත වශයෙන් කවුද කියා පෙන්වා දී නැත. මා අදහස් කරන දේ ඔබ දන්නහු ය (සිනාව). පසුගිය අවුරුදු කීපය තුළ අපේ වැඩවල අඩුපාඩු සහ වැරදි ගැන, වගකීම පළමුකොට රඳා පවතින්නේ මධ්‍යම කාරකසභාව වෙත ය, මධ්‍යම කාරකසභාව තුළ, ප්‍රධාන වශයෙන් මා වෙත ය; දෙවැනිව, පළාත්වල, නගරසභා ප්‍රදේශවල සහ ස්වතන්ත්‍ර ප්‍රාන්තවල පක්ෂ කොමිටි වෙත වගකීම රඳා පවතී; තුන්වැනිව, ප්‍රිපෙක්චර පක්ෂ කොමිටි වෙත ය; සිව්වැනිව, කෝරළ පක්ෂ කොමිටි වෙත ය. පස්වැනිව, ව්‍යවසායවල සහ මහජන කොමියුන්වල පක්ෂ කොමිටි වෙත ය. කොටින් හැම කෙනාට ම වගකීමෙන් ඔහුගේ කොටස තිබේ.

සහෝදරවරුනි, ඔබ ආපසු ගිය විට ඔබ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයට නවජීවනය දිය යුතු ය. කෝරළ පක්ෂ කොමිටිවල සහෝදරවරු ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදයට නව-ජීවනය දීමෙහි ලා කොමියුන් පක්ෂ කොමිටිවලට නායකත්වය දිය යුතු ය. සියල්ලට පළමුව, සාමූහික නායකත්වය ගොඩනැගිය යුතු ය, නැතහොත් ශක්තිමත් කළ යුතු ය. ඔබ නො වෙනස් වන ''වැඩ පරිමණ්ඩල බෙදීම සහ තනි වගකීම'' දිග්ගස්සන නායකත්ව ක්‍රමය තව දුරටත් භාවිතාවේ නො යෙදිය යුතු ය. ඒ ක්‍රමය යටතේ පක්ෂ කොමිටිවල ලේකම්වරුත් සාමාජිකයෝත් එක් එක් කෙනා තනි පංගලමේ වැඩ කරති, සැබෑ සාමූහික සාකච්ඡාවක් හෝ සැබෑ සාමූහික නායකත්වයක් හෝ තිබෙන්නට බැරි ය. ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීම, විවේචන කිරීමට අන්‍යයන්ට දිරි දීම සහ ඔවුන්ගේ විවේචනවලට ඇහුම්කන් දීම අවශ්‍ය ය. විවේචනවලට මුහුණ දීමට අපට පුළුවන් විය යුතු ය. අපි ම මුලපිරුම කොට, පළමුව ස්වයං-විවේචනය කරගෙන යා යුත්තෙමු. අපි පරීක්ෂා කිරීම වුවමනා කරන කවර දෙයක් වුවත්, සියලු ම සන්නම් වන්නම් එළියට අදිමින්, පැයක් හෝ වැඩි ම ගණනේ පැය දෙකක් පරීක්ෂා කළ යුත්තෙමු - එය තොගය ම වෙනවා ඇත. එය ප්‍රමාණවත් නො වේ ය'යි අනික් අය කල්පනා කරත් නම්, ඔවුන්ට කරගෙන යාමට ඉඩ අරින්න. ඔවුන් කියන දේ හරි නම්, අපි ඔවුන්ගේ විවේචනය පිළිගනිමු. මිනිසුන්ට කට ඇර කතා කිරීමට ඉඩ දීම පිළිබඳ කරුණේදී, අපි ක්‍රියාශීලී විය යුතු ද, අක්‍රියාශීලී විය යුතු ද? සත්තකින්ම ක්‍රියාශීලී වීම වඩා හොඳ ය. එහෙත් අප දැනට ම අක්‍රියාශීලි තත්ත්වයක සිටිනවා නම් කෙසේ ද? අපි අතීතයේදී ප්‍රජාතන්ත්‍රවාදී වීමු නම්, එහෙයින් අප දැන් මේ අක්‍රියාශීලී තත්ත්වයෙහි සිටින බව පෙනී යනවා නම්, ඊට කමක් නැත. හැමෝ ම අප විවේචනය කළාදෙන්: ඔවුන් දවස මුළුල්ලේමත් නාට්‍ය බැලීමට යනවා වෙනුවට හවසටත්, ඔවුන්ගේ දුක් ගැනවිලි වගුරද්දෙන්. කරුණාකර ඇවිත් දිවා රෑ දෙකේ ම මා විවේචනය කරන්න. (සිනාව) එවිට මම වාඩිවී, රැයක් හෝ දෙකක් නින්දට පවා අහිමි වෙමින්, සන්සුන් ලෙස එගැන සිතා බලමි. එය මුල සිට අගට ම සිතා බැලීමෙන් සහ තේරුම් ගැනීමෙන් පසු, මම අවංක ස්වයං-විවේචනයක් ලියමි. පිළිවෙල එය නො වේ ද? කොටින්, ඔබ කට ඇර කතා කිරීමට අන්‍යයන්ට ඉඩ දුන හොත්, අහස කඩා වැටෙන්නේ නැත, ඔබ විසිවී පෙරළෙන්නේත් නැත. ඔබ ඉඩ නුදුන්නොත්? ඔබ විසිවී පෙරළී යන දිනය නො වැළැකිය හැකි ලෙස ම එන්නේ ය.

අද මගේ කථාවට මේ ඇති. මා සාකච්ඡා කළ කේන්ද්‍රීය කරුණ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය අත් කර ගන්නේ කෙසේ ද, පක්ෂය තුළත් ඉන් පිටතත් ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය යි. සහෝදරවරුන් මේ ප්‍රශ්නය සැලකිල්ලෙන් කල්පනා කර බැලීම සුදුසු ය'යි මම කියමි. ඇතැම් සහෝදරවරුන් වෙත ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදී සිතීමේ විධිය තව ම නැත. ඔවුන් මේ සිතීමේ විධිය අත් කර ගැනීමට පටන් ගත යුතු සහ මේ ප්‍රශ්නය තේරුම් ගැනීමට පටන් ගත යුතු කාලය දැන් ය, අප ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවේ යෙදෙන්නට සම්පූර්ණයෙන් ඉඩ දෙනවා නම්, පක්ෂය තුළ සහ ඉන් පිටත පුළුල් බහුජන සමූහයන්ගේ උද්‍යෝගය ක්‍රියාකාරීභාවයට පත් කිරීමටත්, මුළු ජනගහනයෙන් සියයට 95 කට වඩා අඩංගු කර ගන්නාවූ පුළුල් බහුජන සමූහයන් එක්සත් කිරීමටත් අපට හැකි වේ. අප මෙය මුදුන්පත් කළ විට, අපේ වැඩ වඩ වඩා හොඳින් කිරීමටත් අපට මුණ ගැසෙන දුෂ්කරතා වඩාත් ඉක්මනින් මැඩපැවැත්වීමටත් අප සමත් වෙනවා ඇත. එවිට අපේ ව්‍යායාමය වඩාත් සන්සුන් ලෙස වර්ධනය වෙනවා ඇත.

(උද්‍යෝගවත් අත්පොළසන්)

http://slmarxist.yolasite.com
http://slmarxist.wordpress.com {Video Archive}
slmarxist@ymail.com